

2020 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව

වෙළඳ අමාත්‍යාංශය

වාණිජ දෙපාර්තමේන්තුව

295 ශීර්ෂය

2020 ஆம் ஆண்டுக்கான செயல்நிறைவேற்று அறிக்கை

வர்த்தக அமைச்சகம்

வர்த்தக திணைக்களம்

தலைப்பு 295

PERFORMANCE REPORT FOR THE YEAR 2020

MINISTRY OF TRADE

DEPARTMENT OF COMMERCE

HEAD 295



වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2020

වාණිජ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංක **295**

පටුන

	පිටු අංක
1. පරිච්ඡේදය - ආයතන පැතිකඩ	03
2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	42
3. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	45
4. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක	52
5. පරිච්ඡේදය - කිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය	53
6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	55
7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව	58
විගණකාධිපති වාර්තාව	ඇමුණුම

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වෙළඳ අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්වීපාර්ශවික, කලාපීය සහ බහුපාර්ශවික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මෙම සන්දර්භය තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්ය භාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ.

1.2. දෙපාර්තමේන්තු දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය

දැක්ම

"ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම"

මෙහෙවර

"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ සේවා නියුක්තිය දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මඟින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මඟින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්වීපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම් වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම."

1.3 වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

1. ලෝක වෙළඳ සංවිධානයේ (WTO) සියලුම මට්ටමේ සාකච්ඡා ක්‍රියාවලිය (එනම් තීරණ ගැනීම සහ තාක්ෂණික) සඳහා සක්‍රීයව සහභාගීත්වයෙන් සහ ඵලදායී නියෝජනයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචියන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම පොදු ස්ථාවරයක් ඇතිකර ගැනීම උදෙසා බහුපාර්ශවීය සම්මේලනයන් හි සමාන අදහස් දරණ රටවල් සමඟ සම්බන්ධ වීම.

2. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය පොදු ක්‍රමය (GSP) වැනි අන්‍යොන්‍ය නොවන වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු සහන සුරක්ෂිත කිරීමට සාකච්ඡා පැවැත්වීම.

3. නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) සහ කලාපීය වෙළඳ ගිවිසුම් (RTA) වැනි අන්‍යොන්‍ය වෙළඳ ගිවිසුම් යටතේ වරණීය වෙළඳපොළ ප්‍රවේශය අත්පත් කර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම.

   සාකච්ඡා යටතට අයත් ගිවිසුම් පහත පරිදි වේ.

   i. බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (BIMSTEC) බංගලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය, ශ්‍රී ලංකාව මියන්මාරය හා තායිලන්තය යන රටවල් මීට අයත් වේ.
   ii. චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA)
   iii. ඉන්දියාව සමඟ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ECTA)
   iv. ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA)

4. වෙළඳපොළ ප්‍රවේශය සම්බන්ධ වර්ධනයන් අධීක්ෂණය කිරීම, ප්‍රධාන විදේශීය අපනයන වෙළඳපොළ තුළ පනවනු ලැබෙන තීරුබදු සහ තීරුබදු නොවන පියවරයන් සහ එවැනි පියවරයන්

මඟින් ශ්‍රී ලංකාවේ අපනයනයන් සඳහා එල්ලවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම හෝ ඉවත් කිරීම සඳහා ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය මට්ටමේ නිසි සාධනීය නියෝජනය තුළින් සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග ගැනීම.

5. ආනයන වෙළඳපොළ තුළ පවතින විශේෂිත වෙළඳපොළ ප්‍රවේශ බාධා විසඳීම සඳහා අවශ්‍ය ප්‍රමිති / ක්‍රියාපටිපාටි ජාතික මට්ටමින් සකස් කරමින් සහ කලාපීය / අන්තර්ජාතික ප්‍රමිති සැකසුම් ආයතනයන්ගෙන් අනුමැතිය / සහතික ලබා ගනිමින් සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග දියත් කිරීම.

6. නිදහස් වෙළඳ ගිවිසුම්, කලාපීය වෙළඳ ගිවිසුම් සහ වරණීය පොදු ක්‍රමය යටතේ වෙළඳපොළ ප්‍රවේශ අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ / වැඩමුළු කොළඹ සහ ප්‍රාදේශීය නගර වල පැවැත්වීම.

7. විදේශීය වෙළඳපොළ තුළ පවතින තීරුබදු හා තීරුබදු නොවන පියවරයන් සහ එවැනි පියවරයන් මඟින් ශ්‍රී ලංකාවේ අපනයනයන්ට වන බලපෑම විශ්ලේෂණය කිරීම මඟින් සැපයුම් පාර්ශවීය බාධා විසඳීම සඳහා උපදෙස් ලබා දීම ද ඇතුළුව විදේශීය රටවල වෙළඳපොළ ප්‍රවේශයට අදාල වර්ධනයන් පිළිබඳ තොරතුරු බෙදාහැරීම.

8. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ප්‍රභවස්ථාන සහතිකපත් ලබා ගැනීමට සුදුසුකම් ඇතිකර ගැනීම පිළිබඳ උපදෙස් ලබාදීම සහ මහපෙන්වීම ඇතුළු ප්‍රභවස්ථාන නීති, නිෂ්පාදනය, ක්‍රියාපටිපාටිමය අවශ්‍යතාවයන් පිළිබඳ විශේෂඥ උපදෙස් ලබාදීම.

9. පහත සඳහන් වරණීය ක්‍රමයන් සහ කලාපීය, ද්විපාර්ශවීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන පහසුකම් සැලැස්වීම සඳහා ප්‍රභවස්ථාන සහතික කඩිනමින් නිකුත් කිරීම.

   i. වරණීය පොදු ක්‍රමය (GSP)
   ii. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
   iii. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
   iv. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
   v. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
   vi. පකිස්ථාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
   vii. ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
   viii. සිංගප්පූරු ශ්‍රී ලංකානිදහස් වෙළඳ ගිවිසුම (SSLFTA)

10. අන්තර්ජාතික වෙළඳාමෙහි නව වර්ධනයන්ට අදාළ මාතෘකා පිළිබඳ සහ ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම් පිළිබඳ විදේශීය සම්පත් දායකයින් සමඟින් පුහුණු වැඩසටහන් / වැඩමුළු කොළඹ සහ ප්‍රාදේශීය නගරයන් හි සංවිධානය කිරීම.

11. ශ්‍රී ලංකාව තුළට සහ පිටතට භාණ්ඩයක් ආනයනය කිරීමේදී හෝ අපනයනය කිරීමේදී අනුකූල විය යුතු සියළුම අවශ්‍යතාවයන්ට අදාළ විමසීමකට පිළිතුරු වශයෙන් තොරතුරු ලබාදෙන, ආයතන 41 ක අපනයන සහ ආනයන ක්‍රියාපටිපාටි පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඇතුළත් "ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය (SLTIP) " පවත්වා ගැනීම.

12. විදේශීය පාර්ශවයක් සහ ශ්‍රී ලංකාව අතර ඇති වන වෙළඳ ආරවුල් සාමකාමීව විසඳීම සඳහා සහය ලබා දීම.

13. අපනයනකරුවන් වෙත ආනයනික රටවල්වලින් සිය නිෂ්පාදනයන්ට යොමු කෙරෙන ප්‍රපාතන විරෝධී විමර්ශනයන් සඳහා පිළිතුරු සම්පාදනය කිරීමට මග පෙන්වීම සහ සහය ලබා දීම.

14. ශ්‍රී ලංකාවේ අපනයන, ආනයනික රට තුළ ප්‍රතිතෝලන බදු විමර්ශනයන් සඳහා යටත්වන විට එය විශ්ලේෂණය කිරීම හා ඊට පිළිතුරු සකස් කිරීම.

15. විදේශ වාණිජ නියෝජනය - වෙළඳාම ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සන්කාරක රටවලදී ශ්‍රී ලංකාවේ වාණිජ හා ආර්ථික අපේක්ෂා ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම සඳහා වන වාණිජ දෙපාර්තමේන්තුවේ විදේශ වාණිජ නියෝජනය කිරීමේ කාර්යය එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල 30 ක් නියෝජනය කරන නිලධාරීන් 31න් සමන්විත වේ.

16. පවතින්නා වූ මෙන්ම විභවීය ශ්‍රී ලාංකීය නිෂ්පාදන සඳහා වෙළඳ පොළ ප්‍රවේශය පිලිබඳ පර්යේෂණ පැවැත්වීම.

17. නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීම

18. ණය දෙන ආයතන අනුමත කිරීම

19. ඒකාබද්ධ කොමිසම/කමිටු (JCs) සහ වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම් (TIFAs) සංවිධානය කිරීම/ සම්බන්ධීකරණය කිරීම.

1.4 වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



කෙටි යෙදුම්

D	අධ්‍යක්ෂ
DD	නියෝජ්‍ය අධ්‍යක්ෂ
AD	සහකාර අධ්‍යක්ෂ
CRO	වාණිජ පර්යේෂණ නිලධාරී
Mgt. Asst.	කළමනාකරණ සහකාර
OES	කා.කා.සහායක

*ඉහළම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් (අධ්‍යක්ෂ මට්ටමේ) තානාපති/ නිත්‍ය නියෝජිත වශයෙන් ලෝක වෙළඳ සංවිධානය, වොෂින්ග්ටන්, ලන්ඩන්, බ්‍රසල්ස්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ කරච්චි යන ස්ථානවල දූත මණ්ඩල සඳහා පත් කිරීම අවශ්‍ය වේ.

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ සහ ඒවායෙහි කාර්යසාධනය

1.5.1 බහුපාර්ශවික වෙළඳ සබඳතා අංශය

ශ්‍රී ලංකාවේ බහුපාර්ශවික වෙළඳ සබඳතා මඟින් මූලික වශයෙන් ලෝක වෙළඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ද ඇතුළත්ව, වෙනත් බහුපාර්ශවික සංවිධාන කිහිපයක් සමඟ ද ශ්‍රී ලංකාව සමීප සම්බන්ධතාවයක් පවත්වා ගෙන යනු ලැබේ.

I. **2018 මැයි මාසයේ දී පාර්ලිමේන්තුවේදී සම්මත වන ලද 2018 අංක 2 ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සහ 2018 අංක 3 දරණ අරක්ෂණ පියවර පනත ක්‍රියාත්මක කිරීම**

2020.10.19 පනත් දෙක බලාත්මක කිරීම සඳහා ගැසට් නිවේදන 02 ක් ප්‍රකාශයට පත් කර ඇති අතර, නියාමන පනත් කට්ටල දෙකක් නීති කෙටුම්පත්කරු වෙත සමාලෝචනය සඳහා ඉදිරිපත්කර ඇත. අභ්‍යන්තර චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ කෙටුම්පත් කරමින් පවතී. මෙම විෂය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

අ. වෙළඳ පිළියම් පිළිබඳව මුද්‍රිත/ විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීම

වෙළඳ පිළියම් පනත් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විස්තර සටහනක් අමාත්‍ය මණ්ඩලයට යවා ඇත. කර්මාන්ත අමාත්‍යාංශය විසින් ප්‍රවෘත්තියක් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ පිළිබඳ සටහනක් වෙළඳ මණ්ඩල සහ නිෂ්පාදන සංගම් අතර ද බෙදා හරින ලදි.

ආ. වෙළඳ පිළියම් පිළිබඳව වෙනත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශය පුහුණු කිරීම

කෝවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් ජිනීවා හි ලෝක වෙළඳ සංවිධානය (WTO) වෙතින් සම්පත්දායකයෙකුගේ සේවය ලබා ගැනීමට නොහැකි විය.

ඇ. ඒකකය සඳහා ආර්ථික විශ්ලේෂඥයකු බඳවා ගැනීම

වෙළඳ පිළියම් ඒකකය වෙත ආර්ථික විශ්ලේෂඥයකු බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගන්නා ලදී. අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

II. **WTO වෙත නිවේදන ඉදිරිපත් කිරීම**

නිවේදන ඉදිරිපත් නොකර, ලෝක වෙළඳ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත විසින්, ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සඳහා තාවකාලික අත්හිටුවීම සහ ණය සීමා කිරීම බලාත්මක කිරීමේ පදනම පිළිබඳව පැහැදිලි කිරීම් ලබා දෙන ලදී. ඉදිරිපත් කිරීමක් කරන්නේ නම් එය ගෙවුම් ශේෂය යටතේ තිබිය යුතු අතර එය රටේ ණය ශ්‍රේණිගත කිරීම කෙරෙහි බරපතල ප්‍රතිවිපාක ගෙන දිය හැකිය.

III. **ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකරණ ගිවිසුමේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම**

අ. එක් එක් විෂය ක්ෂේත්‍රයේ විමසුම් ස්ථාන වාණිජ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම

එක් එක් විෂය ක්ෂේත්‍රයේ විමසුම් ස්ථාන වාණිජ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම නිසි පරිදි සම්පූර්ණ කරන ලදී.

ආ. වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය (SLTIP) සහ පියවරෙන් පියවර ක්‍රියාකාරිත්වය මගින් සපයනු ලබන සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්.

ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සමඟ එක්ව වර්ෂය තුළදී අපනයනකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පහක් පවත්වන ලදී. වසරේ පළමු වැඩසටහන පෙබරවාරි 12 වන දින මහනුවරදී ද දෙවන වැඩසටහන පෙබරවාරි 13 වන දින කුරුණෑගලයේදී ද පැවැත්විණි. තෙවන වැඩසටහන පෙබරවාරි 18 වන දින ගාල්ලේ දී පැවැත්විණි. සිව්වන වැඩසටහන පෙබරවාරි 20 වන දින යාපනයේ දී ද, අවසන් කිරීමේ සැසියක් පෙබරවාරි 28 වන දින කොළඹදී ද පැවැත්විණි.

ඇ. ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය (SLTIP) තුළ යාවත්කාලීන කිරීම් සිදු කිරීම

ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය වර්ශය පුරාම යාවත්කාලීනව තබා ඇත්තේ රාජ්‍ය ආයතන 40 ක තොරතුරු නිරතුරුව (මාසික) ලබා ගැනීමෙනි.

ඈ. ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය (SLTIP) වෙත ශ්‍රී ලංකාව තුළ සත්කාරකත්වය දැරීමට කටයුතු සැලසීම.
ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරයෙහි වර්තමාන සත්කාරක සමාගම වන ලෝක බැංකුව 2021 ජූනි මාසය දක්වා තවත් වසරක සත්කාරක පිරිවැය දැරීමට එකඟ විය. 2021 ජූනි මස සිට ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය සත්කාරකත්වය හා නඩත්තුව සඳහා සුදුසු සමාගමක් තෝරා ගැනීමේ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් සිටී. ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) සමඟ තාක්ෂණික තොරතුරු සාකච්ඡා කෙරෙමින් පවතී

ඉ. අපනයන ක්‍රියා පටිපාටි සඳහා පියවරෙන් පියවර ක්‍රියාකාරිත්වය හඳුන්වා දීම

තෝරාගත් නිෂ්පාදනවල අපනයන ක්‍රියා පටිපාටි සඳහා පියවරෙන් පියවර ක්‍රියාකාරිත්වය හඳුන්වා දීමට වාණිජ දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී. ඒ අනුව නිෂ්පාදන 19 ක් සැලසුම් කර ඇති අතර සැලසුම් කළ ක්‍රියා පටිපාටි වලංගු කිරීම සිදු කෙරේ. වර්ෂය අවසානයේදී 90% දක්වා වලංගු කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ විය

ඊ. කාබනික පලතුරු හා එළවළු, කාබනික කුරුඳු, කුරුඳු තෙල් සහ පිරිසිදු පොල්තෙල් අපනයන ක්‍රියා පටිපාටි සරලකරණය සඳහා වූ යෝජනාව

සරලකරණය කරන ලද පියවර ලැයිස්තුගත කර අනුමැතිය සඳහා අදාළ ආයතන වෙත යවන ලදි. වර්ෂය අවසානයේ දී සරල කිරීමේ ක්‍රියාවලිය 90% දක්වා සම්පූර්ණ කරන ලදී.

IV. WTO තොරතුරු තාක්ෂණ ගිවිසුම

අ. ලෝක වෙළඳ සංවිධානයේ තොරතුරු තාක්ෂණ ගිවිසුම (ITA) අත්සන් කිරීමේ යෝග්‍යතාවය පිරික්සීම සඳහා පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම.

2020 මාර්තු 05 වන දින පාර්ශවකරුවන්ගේ රැස්වීමක් පවත්වන ලදී. වාණිජ දෙපාර්තමේන්තුවේ ස්ථාවරය වන්නේ බැඳීම් කර්තව්‍යන් ඉටු කරමින් ලෝක වෙළඳ සංවිධානයේ තොරතුරු තාක්ෂණ ගිවිසුමේ පාර්ශවකරුවෙකු නොවී සිටීම සහ අයිටීසී නිෂ්පාදන සඳහා තීරුබදු එකින් එක ඉවත් කිරීම සලකා බැලීම ය.

ආ. WTO තොරතුරු තාක්ෂණ ගිවිසුම පිළිබඳ වැඩමුළුව (ITA)

කෝවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් ජිනීවා හි ලෝක වෙළඳ සංවිධානය (WTO) වෙතින් සම්පත්දායකයෙකුගේ සේවය ලබා ගැනීමට නොහැකි විය.

V. 2020 ජූනි මාසයෙන් ඔබ්බට ඉලෙක්ට්‍රොනික සම්ප්‍රේෂණය පිළිබඳ තීරුබදු සඳහා ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රමාද සහනය දීර්ඝ කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ස්ථාවරය

2020 පෙබරවාරි 13 වන දින පැවති රැස්වීමකදී, ප්‍රමාද සහනය දීර්ඝ කිරීමට ඒකමතිකව එකඟ විය.

VI. වෙළඳාම පිළිබඳ තාක්ෂණික බාධක (TBT) ආශ්‍රිත කරුණු පිළිබඳ නිතිපතා රැස්වීම් සහ සැසිවාර සඳහා හිටපු නිලධාරි සහභාගීත්වය.

කොවිඩ් -19 වසංගතයට අදාළ සෞඛ්‍ය උපදෙස් හේතුවෙන් රැස්වීම් නොපැවැත්විණි.

VII. චීනය විසින් යෝජනා කරන ලද ලෝක වෙළඳ සංවිධානයේ ආයෝජන පහසුකම් සැපයීමේ ගිවිසුම පිළිබඳ ශ්‍රී ලංකාවේ ස්ථාවරය

චීනය විසින් යෝජනා කරන ලද ලෝක වෙළඳ සංවිධානයේ ආයෝජන පහසුකම් සැපයීමේ ගිවිසුමේ අන්තර්ගත සම්බන්ධය පිළිබඳව ආයෝජන මණ්ඩලය (BOI) සහ වාණිජ දෙපාර්තමේන්තුව (DOC) අධ්‍යයනය කරමින් සිටින අතර අධ්‍යයනයෙන් 45% ක් වසර අවසානයේදී සම්පූර්ණ විය.

VIII. වෙළඳ භාණ්ඩ සඳහා වන පොදු අරමුදලේ (CFC) පාලක සභා රැස්වීම්වලදී ශ්‍රී ලංකාවේ අභිරුචිය නියෝජනය කිරීම

වෙළඳ භාණ්ඩ සඳහා වන පොදු අරමුදල විසින් සපයනු ලබන ව්‍යාපෘති මූල්‍ය පහසුකම් වලින් ශ්‍රී ලංකාවේ පාර්ශවයකට අරමුදල් සැපයීම සඳහා නිර්දේශ සහිත යෝජනාවක් ලබා ගැනීමට හා ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණද, ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාවෙන් කිසිදු යෝජනාවක් ලැබුණේ නැත.

IX. රාජ්‍ය ප්‍රසම්පාදන ගිවිසුමට (GPA)අනුගත වීමේ හැකියාව සොයාබැලීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පිහිටුවන ලද කම්ටුවකට සහභාගී වීම.

වාණිජ දෙපාර්තමේන්තුව GPA පිළිබඳ සිය නිරීක්ෂණ යවා ඇත. වර්ෂය තුළ රැස්වීම් කිසිවක් පවත්වා නැත.

X. ලෝක වෙළඳ සංවිධානයේ (MC12) 12 වන අමාත්‍ය සමුළුවේදී ශ්‍රී ලංකා දූත කණ්ඩායම නියෝජනය කිරී

පවතින කොවිඩ් -19 වසංගතය හේතුවෙන් 12 වන අමාත්‍ය සම්මේලනය 2021 මැද භාගය දක්වා කල් තබන ලදී. රැස්වීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් සූදානම් වීමේ කටයුතු අදාල ආයතන සමඟ සාකච්ඡා කරමින් අඛණ්ඩව සිදු කෙරේ.

XI. සීවර සහනාධාර නියාමනය පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව සිදු කිරීම

ලෝක වෙළඳ සංවිධානයේ සටහන් පදනම් කරගත් සාකච්ඡා අඛණ්ඩව සිදු වෙමින් පවතී. ලෝක වෙළඳ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත විසින් සීවර දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ශ්‍රී ලංකාවේ පාර්ශවය වෙනුවෙන් කෙරෙන සාකච්ඡා සඳහා යෙදවුම් සපයනු ලබයි.

XII. කෘෂිකාර්මික නියාමන සාකච්ඡා - ශ්‍රී ලංකාවේ තීරුබදු බැඳීම (50%) සංවර්ධනය වෙමින් පවතින රටවලට සාපේක්ෂව අඩු බැවින් කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වන විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණය පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව සිදු කිරීම.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරවිශේෂ ආරක්ෂණ යාන්ත්‍රණය පිළිබඳ ශ්‍රී ලංකාවේ ස්ථාවරය පිළිගත හැකි යැයි තීරණය කරන ලදී. කෙසේ වෙතත්, වර්ෂය ආරම්භයේදී අපේක්ෂා කළ පරිදි ලෝක වෙළඳ සංවිධානයේ සාකච්ඡා වල කිසිදු ප්‍රගතියක් අත් වී නොමැත.

XIII. ලෝක වෙළඳ සංවිධානයේ SVE සහ NFIDC වල සාමාජිකයන් සමඟ එක්ව විශේෂ සහ වෙනස්කොට සැලකීම (S&DT) සඳහා යෝජනා ඉදිරිපත් කිරීම මඟින් කුඩා හා අවදානමට ලක්විය හැකි ආර්ථිකයක් (SVE) සහිත රටක් ලෙස මෙනම ශුද්ධ ආහාර ආනයනය කරන සංවර්ධනය වෙමින් පවතින රටක් (NFIDC) ලෙස ශ්‍රී ලංකාවට විශේෂ සැලකිල්ලක් අත්කර ගැනීම සුරක්ෂිත කිරීම.

ලෝක වෙළඳ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත විසින් ජිනීවාහි සමාන අදහස් දරණ රටවල් සමඟ විශේෂ සහ වෙනස්කොට සැලකීමක් ලබා ගැනීම සඳහා සක්‍රියව ක්‍රියාකරමින් සිටී.

XIV. විශ්ලේෂණ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම සඳහා කුඩා නියෝජන සංකල්පය යටතේ WTO කෙටිකාලීන පුහුණු වැඩසටහන් සඳහා අරමුදල් ලබා ගැනීම

කෝවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් ලෝක වෙළඳ සංවිධානය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් අවලංගු කරන ලදී.

1.5.2 ද්වීපාර්ශික කටයුතු අංශය

I. ඉන්දු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

2000 වර්ෂයේ සිට බලාත්මක ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) මඟින් ඉන්දියානු වෙළඳ පොළ වෙත ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා සුවිශේෂී දායකත්වයක් අඛණ්ඩව ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට සිදුකළ අපනයනවල සමස්ත වටිනාකම 2020 වර්ෂයේ දී ඇ.ඩො. මිලියන 604.5 වන විට 2019 වර්ෂයේ ඇ.ඩො. මිලියන 759.03 වාර්තා වී ඇත. ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට සිදුකළ අපනයන වලින් 60% කට ආසන්න ප්‍රමාණයක් ISFTA ගිවිසුම් සහන යටතේ සිදුකර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාව විසින් ISFTA ගිවිසුම යටතේ ඉන්දියාවට 2020 වර්ෂයේදී ඇ.ඩො.මි 489.69 වටිනාකමකින් යුක්ත භාණ්ඩ අපනයනය කර ඇති අතර 2019 වර්ෂයේදී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 358.54 ක ක් වටිනා භාණ්ඩ අපනයනය කර ඇත.

සත්ව ආහාර, කරුංකා පුවක්, සත්ව හෝ එළවළු මේද හා තෙල් සහ ඒවායේ අතුරු කොටස්, පරිවරණය කරන ලද තඹ රැහැන් සහ කේබල්, අපද්‍රව්‍ය සහ සුන්බුන් කඩදාසි සහ කඩදාසි පුවරු, ගෘහ භාණ්ඩ, අත්‍යවශ්‍ය තෙල්, ඛනිජ ජලය සහ වාතිත ජලය, බයිසිකල්, ඇඟලුම් ආදිය ISFTA යටතේ ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කරනු ලබන ප්‍රධාන අයිතම අතර වේ. සමාලෝචිත වර්ෂයේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් ISFTA ගිවිසුම යටතේ ප්‍රභවස්ථාන සහතිකපත් 13,743 ක් නිකුත්කර ඇත. ISFTA අයත් මිලියන 8 ක වාර්ෂික ඇඟලුම් කෝටාව යටතේ, ශ්‍රී ලංකා අපනයනකරුවන් 2020 දී ඇඟලුම් කොටස් 3,487,608 ක් (HS 61 සහ 62 පරිච්ඡේද යටතේ) ඉන්දියාවට අපනයනය කර ඇති අතර එය 2019 දී 96% ට අගයට සාපේක්ෂව 44% ක උපයෝගීතා අනුපාතයක් ඇත. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අපනයන පහත වැටීම 2020 දී මෙසේ සාපේක්ෂව අඩු වී ඇත.

ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ආශ්‍රිත ගැටලු නිරාකරණය සඳහා වාණිජ දෙපාර්තමේන්තුව අදාළ දේශීය පාර්ශවකරුවන් සේම ඊට අදාළ ඉන්දීය පාර්ශවකරුවන් සමඟ සෑම විටම සම්බන්ධ වුවත් තවමත් එයින් සමහරක් සිදුවෙමින් පවතී. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ආශ්‍රිත ගැටලු නිරාකරණය සඳහා වාණිජ දෙපාර්තමේන්තුව අදාළ දේශීය පාර්ශවකරුවන් සේම ඊට අදාළ ඉන්දීය පාර්ශවකරුවන් සමඟ සෑම විටම සම්බන්ධ වුවත් තවමත් එයින් සමහරක් සිදුවෙමින් පවතී. එයට ගම්මිරිස් සඳහා ප්‍රමාණාත්මක සීමාවන්, ගම්මිරිස් සහ දිසිදි පොල් සඳහා අවම ආනයන මිල ගණන් සහ වනස්පති නිෂ්පාදන සඳහා

කෝටාව වෙන් කිරීම ආදිය ඇතුළත් වේ. 2020 දී, FTA තීරුබදු සහන යටතේ තෙවන රට සම්භවයක් ඇති කුළුබඩු සහ ඊට අනුබද්ධ නිෂ්පාදන නැවත ප්‍රතිඅපනයන කිරීම නැවැත්වීමට ද දෙපාර්තමේන්තුව විසින් දැඩි පියවර ගෙන තිබේ.

II. පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

2005 වර්ෂයේ සිට බලාත්මක පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) මඟින් ද දෙරට අතර සිදුකරන ද්වීපාර්ශ්වික වෙළඳ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා දායකත්වයක් ලබා දී ඇත. 2020 වර්ෂයේ දී පකිස්ථානයට සිදුකරන ලද අපනයනවල වටිනාකම ඇ.ඩො.මිලියන 74.27ක් වූ අතර එයින් ඇ.ඩො.මිලියන 53.01 ක අපනයන සිදුකර ඇත්තේ PSFTA ගිවිසුම යටතේය. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ PSFTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකළ අපනයන අතර ප්‍රධාන නිෂ්පාදන වනුයේ පොල්, බුලත් කොළ, දුම් ගසන ලද ස්වාභාවික රබර්, අන්තරවරණ පොල්, එම්ඩීඑෆ් පුවරු, කොප්පරා, ශල්‍ය අත්වැසුම්, ක්‍රේප් රබර්, පිරිපහදු කළ රබර් ආදිය.

PSFTA යටතේ, පාකිස්තානයෙන් වාර්ෂිකව මෙට්‍රික් ටොන් 6,000 ක බාස්මතී සහල් ආනයනය කිරීමට ශ්‍රී ලංකාව එකඟ වී තිබේ. 2020 කෝටාව සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රාජ්‍ය වෙළඳ සංස්ථාව (Sri Lanka State Trading Corporation Ltd.) විසින් කෝටාව ආනයනය කිරීම සඳහා සීපී අංක 20/1878 / 313/020-I දරණ 2020-11-18 දිනැති අමාත්‍යාමණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. 2021 දී 2020 සහ 2021 කෝටා ආනයනය කිරීමට ද අනුමැතිය ලබා දෙන ලදී.

තෙවන රටක ප්‍රභවය සහිත සියඹලා පාකිස්තානයට අපනයනය කිරීම නැවැත්වීමට ද වාණිජ දෙපාර්තමේන්තුව විසින් රේගු දෙපාර්තමේන්තුව සමඟ එක්ව පියවර ගන්නා ලදී. පාකිස්තාන-ශ්‍රී ලංකා ඒකාබද්ධ ආර්ථික කමිටුවේ 12 වන සැසිවාරය පැවැත්වීමේ සූදානම ද 2021 වර්ෂයේ පළමු වන කාර්තුවේ දී JEC පැවැත්වීම සඳහා කාර්යය සැලැස්මක් සකස් කරමින් සිදු කෙරිණි.

III. ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව අතර නිදහස් වෙළඳ ගිවිසුම

ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) 2018.01.23 දින අත්සන් කරන ලද අතර එය 2018.05.01 දින සිට බලාත්මක විය. SLSFTA ගිවිසුම මඟින් භාණ්ඩ, සේවා, ආයෝජන, බුද්ධිමය දේපළ, විදුලි සංදේශ, ඊ-වාණිජ්‍යය, වෙළඳ පහසුකම් සැපයීම, රාජ්‍ය ප්‍රසම්පාදනය, තරහකාරිත්වය සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව ආවරණය කරයි.

SLSFTA ක්‍රියාවට නැංවීමෙන් පසුව, ජන සමාජයේ විවිධ පාර්ශව විසින් ඒ පිළිබඳ සීය විවිධ මතවාද පළ කරන ලද අතර, 2018.08.10 දින එවකට සිටි අගිහරු ජනාධිපතිවරයා විසින් SLSFTA පිළිබඳ ඇගයීමක් සිදු කිරීම සඳහා විශේෂඥ කමිටුවක් (CoE) පත් කරන ලදී. 2018.11.30 දින ඉදිරිපත් කරන ලද CoE වාර්තාවේ නිර්දේශ මත පදනම්ව, SLSFTA අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය සංශෝධන සිදුකිරීමට පියවර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව කැබිනට් අනුකමිටුවක් පත් කරන ලදී.

ඉන්පසුව, එවකට සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට (MODSIT) අදාළ රාජ්‍ය ආයතන 25 කින් සංශෝධන සඳහා යෝජනා 31 ක් ලැබී තිබේ. පසුව, 2011.10.15 දින පැවති 05 දෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් අමාත්‍ය අනුකමිටුවේ 02 වන රැස්වීමේදී, SLSFTA ඒකාබද්ධ කමිටුවේදී සාකච්ඡා සඳහා යෝජනා 18 ක් අනුමත කරන ලදී.

SLSFTA දැන් වෙළඳ අමාත්‍යාංශය යටතට පැමිණ ඇති බැවින්, මෙම යෝජිත සංශෝධන 18 සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සහ ඉහත සංශෝධන පිළිබඳ එකඟතාවයකට පැමිණීමේ

අරමුණින් සිංගප්පූරුව සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩල කෙටුම්පත් පත්‍රිකාවක් සකස් කර 2020.12.21 දින වෙළඳ අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

ඒ අතරම, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති SLSFTA සඳහා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ අභියාචනා නවයක් (09) සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නියමයන්ට අනුව, 2020 නොවැම්බර් 3 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ දී නඩු නියම කරන ලදී. කෙසේ වෙතත්, කොළඹ මහ නගර සභාවේ කොවිඩ් -19 අගුලු දැමීමේ තත්ත්වය හේතුවෙන් නඩුව නොපැවැත්වූ අතර එය 2021 දී සිදුවනු ඇත.

IV. වෙනත් යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් හා සම්බන්ධ වර්ධනයන්

සමාලෝචන කාලය තුළදී, දැනට අත්හිටුවා ඇති ශ්‍රී ලංකාවේ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ තත්ත්ව වාර්තා වාණිජ දෙපාර්තමේන්තුව විසින් සකස් කර වෙළඳ, මුදල් හා විදේශ අමාත්‍යවරුන් කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය අමාත්‍යය, ජනාධිපති ලේකම් කාර්යාලය සහ අදාල අමාත්‍යාංශවල ලේකම්වරු වෙත ඉදිරිපත් කර ඇත.

- 2014 සැප්තැම්බර් 16 වන දින දියත් කළ සාකච්ඡා සහ සාකච්ඡා වට 06ක් අවසන් කර ඇති චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA)
- 2016 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදුව සාකච්ඡා සහ සාකච්ඡා වට 11ක් පවත්වන ලද ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ECTA)
- 2017-06-02 දින යෝජනා කරන ලද අතර සාකච්ඡා වට 02ක් අවසන් කර ඇති ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA)

V. ශ්‍රී ලංකාව හා යුරෝපා සංගමය අතර වෙළඳ සබඳතා

අ. ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා

ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය ඇතුළු යුරෝපා සංගමයේ රටවල් දිගු කලක් සිටම වෙළඳ හා ආර්ථික පාර්ශවයන් වේ.ශ්‍රී ලංකාව සහ යුරෝපා සංගමය අතර සමස්ත වෙළඳ පිරිවැටුම 2015 සිට 2019 දක්වා ධනාත්මක රටාවකින් පැවතුනි. 2018 දී ඇමරිකානු ඩොලර් මිලියන 5524 ක් වූ ශ්‍රී ලංකාව සහ යුරෝපා සංගමය අතර සමස්ත වෙළඳ පිරිවැටුම 2019 දී ඇමරිකානු ඩොලර් මිලියන 5503 ක් දක්වා සුළු වශයෙන් අඩුවී ඇති අතර එය ප්‍රධාන වශයෙන් මෝටර් වාහන ආනයනය අඩුවීමයි.

ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට වෙත අපනයනය කිරීම ක්‍රමයෙන් ඉහළ යනවිට ශ්‍රී ලංකාව යුරෝපා සංගමයෙන් සිදු කරනු ලබන ආනයනය උච්චාවචනය වෙමින් පවතී. වෙළඳ ශේෂය සැමවිටම ශ්‍රී ලංකාවට පක්ෂව පැවතුණි.කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් කෝවිඩ් -19 ගෝලීය වසංගතය සහ එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත් වීමට ගෙන ඇති තීරණය නිසා (BREXIT), 2019 ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලය තුල ශ්‍රී ලංකාවේ වාර්ෂික අපනයනයට සාපේක්ෂව 2020 වර්ෂයේ එම කාලපරාසය තුළ දී ශ්‍රී ලංකාවේ වාර්ෂික අපනයන 11.7% කින් අඩු වී තිබේ.

2020 දී ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට කළ අපනයන වටිනාකමෙන් 61%ක්ම ප්‍රමුඛ අපනයන අයිතමය වී ඇත්තේ ඇඟලුම් ය.2020 දී යුරෝපා සංගමයට කරන ලද අනෙකුත් අපනයන භාණ්ඩ වන්නේ වායව ටයර් (4.2%), තේ (3.7%), දුම්කොළ (2.5%) යනාදියයි. 2020 දී ශ්‍රී ලංකාව යුරෝපා සංගමයෙන් ලබාගත් මුළු ආනයනයන්ගෙන් 9.5% ක් සඳහා ප්‍රධානතම ආනයන භාණ්ඩය මෝටර් රථ වන අතර යුරෝපා සංගමයේ සිට ශ්‍රී ලංකාව වෙත ආනයනය කරන අනෙකුත් ප්‍රධාන භාණ්ඩ වන්නේ යකඩ සහ වානේ (7.4%), ඔප්ටිකල් ශල්‍ය උපකරණ (5.8%) ය.

ආ. යුරෝපා සංගමයේ GSP + (EU GSP) සහන සහ එහි උපයෝජනය

ශ්‍රී ලංකාව විසින් 1971 සිට 2005 දක්වා යුරෝපා සංගමයේ සම්මත ජීඑස්පී යෝජනා ක්‍රමය භාවිතා කරන ලදී.මූලික මානව හිමිකම්, කම්කරු අයිතිවාසිකම් සහ අනෙකුත් තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත්

ජාතීන්ගේ සම්මුතීන් 27 ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ නිත්‍ය අධීක්ෂණය සහයෝගීතාව ව්‍යාප්ත කිරීම මත යුරෝපා සංගමය විසින් ආර්ථික වශයෙන් අවදානමට ලක්වන සංවර්ධනය වෙමින් පවතින රටවලට සහාය වීම සඳහා ලබා දී ඇති GSP + පහසුකම 2005 දී ශ්‍රී ලංකාව වෙත පිරිනමා ඇත. 2010 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයේ GSP + අහිමි වූ අතර එතැන් සිට 2017 මැයි දක්වා ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට සිදු කරන අපනයන සඳහා සම්මත GSP යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීය. ශ්‍රී ලංකාව 2017 මැයි 19 වන දින GSP + නැවත ලබා ගැනීමට සමත් විය.

ආරම්භයේ සිටම, යුරෝපා සංගමයේ GSP යෝජනා ක්‍රමය, ශ්‍රී ලංකාව යුරෝපා සංගමය වෙත කරන සමස්ත අපනයන වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ අපනයනයන් විවිධාංගීකරණය කිරීමට GSP සහන උපකාරී විය.

ලෝක බැංකුවේ දළ ජාතික ආදායම් (GNI) ගණනය කිරීම් වලට අනුව 2018 දී ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත් වූ නමුත් 2020 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද GNI දත්තවලට අනුව ශ්‍රී ලංකාව 2019 දී නැවතත් පහළ-මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත්විය.

2010 දී ශ්‍රී ලංකාවේ GSP + උපයෝගීතා අනුපාතය 73% ක් වූ අතර එය වසරක් තුළ වාර්තා වූ ඉහළම ප්‍රතිශතයයි. 2010 අගෝස්තු සිට 2017 දක්වා GSP යටතේ යුරෝපා සංගමයට සිදු කරන ලද ශ්‍රී ලංකාවේ අපනයන යුරෝ 2.1 බිලියන සිට යුරෝ 2.6 දක්වා ඉහළ ගොස් ඇති අතර, ජීඑස්පී උපයෝගීතා අනුපාතය 2011 දී 66% සිට 2017 දී 55% දක්වා අඩු වූ නමුත් 2018 දී 58% සිට 2019 දී 63% දක්වා වැඩි වී ඇත.

2011 සිට 2017 දක්වා කාලය තුළ අපනයන, 2013 හැර, සාමාන්‍යයෙන් ඉහළ ගොස් ඇති අතර, උපයෝගීතා අනුපාතය පහත වැටී ඇත. සාමාන්‍යයෙන් නිරීක්ෂණය වී ඇත්තේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, වැඩි දියුණු කරන ලද GSP සහන සහ 1990 සිට 2010 දක්වා දශකය තුළ ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට සිදු කළ අපනයනවල වර්ධනය අතර ධනාත්මක සහසම්බන්ධයක් ඇති බවය. මෙම ධනාත්මක සහසම්බන්ධය 2017 දී GSP + නැවත ලබා ගැනීමෙන් පසුවද අඛණ්ඩව පවතී.

GSP + යටතේ නිෂ්පාදන රේඛා 7,000 කට වඩා ශුන්‍ය තීරුබදු මට්ටමක පැවතුනද, පහත වගුවේ දක්වා ඇති පරිදි මෑත කාලීන ක්ෂේත්‍ර අනුව GSP + උපයෝගීතාවය බැලූ කල GSP+ යටතේ ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන අංශ කිහිපයක් කෙරෙහි පමණක වැඩියෙන් සංකේන්ද්‍රණය වී ඇති බව දක්නට ලැබේ. ඇඟලුම් ක්ෂේත්‍රයේ පහළ උපයෝගීතාවය සඳහා හේතුව වන්නේ දැඩි ප්‍රභවස්ථාන නීතීන්වලට (ROOs) අනුකූල වීමේ පිරිවැය තීරුබදු සහනවලින් ලැබෙන ප්‍රතිලාභයට වඩා බෙහෙවින් වැඩි වීමයි.

නිෂ්පාදන අංශය	උපයෝගීතා අනුපාතය (2019)	සටහන්
පරිච්ඡේදය 61 සහ 62- ඇඟලුම්	51.75%	දැඩි ප්‍රභවස්ථාන නීති (ROO) යටතේ නූල් සිට රෙදි දක්වාද රෙදි සිට ඇඟළුම් දක්වා ද ද දෙවරක් පරිණාමනය කළ යුතු වීම.
රබර් නිෂ්පාදන	96.38%	බොහෝ දුරට "අගය එකතු කළ" ROO සහිත " එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROO
මාළු නිෂ්පාදන	99.48%	"එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROO
ආහාරයට ගතහැකි සැකසූ	96.92%	"එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROO
බයිසිකල්	96.32%	බොහෝ දුරට "අගය එකතු කළ" ROO
ඇඟලුම් උපාංග	77.58%	61 වන සහ 62 වන පරිච්ඡේදවල ඇඟලුම්වලට වඩා සාපේක්ෂව දැඩි බව මදක් අඩු ROO
උපකරණ සහ කොටස්	41.28%	බොහෝ දුරට "අගය එකතු කළ" ROO
සෙල්ලම් බඩු	86.94%	"එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROO සහ "අගය එකතු කළ" ROO දෙකම

හිස් ආවරණ කොටස්	87.04%	බොහෝ දුරට "අගය එකතු කළ" ROO
තේ සහ කුළුබඩු	73.99%	බොහෝ දුරට "එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROO
සාමාන්‍ය උපයෝජනය	63%	2018 දී 58%කින් වැඩි විය

GSP + සහනය ලබා ගැනීමේ අරමුණ වන්නේ යුරෝපා සංගමයේ සාමාජික රටවලට සිදු කරන ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනය වැඩි දියුණු කිරීමයි. යුරෝපා සංගමය වෙත රටක් විසින් සිදු කරන අපනයනය වර්ධනය වන අවස්ථාවකදී සමහින්ම GSP ක්‍රමය උපයෝජනය අඩු වනු ඇත. එයින් ඇඟවෙන්නේ රටක අපනයනය GSP+ මත දැඩි ලෙස රඳා නොපවතින බවයි. GSP+ තීරුබදු සහනය නොමැතිව ශ්‍රී ලංකාවේ අපනයනයන්ට තරඟ කළ හැකි හිතකර වර්ධනයක් වේ.

ඇ. යුරෝපා සංගමයේ සෞඛ්‍ය සහ ස්වස්ථතා (SPS) සහ වෙළඳාම සඳහා තාක්ෂණික බාධා (TBT)

- **ආහාර සහ පෝෂණය පිළිබඳ සීඝ්‍ර අනතුරු ඇඟවීමේ පද්ධතිය (RASFF)**

ආහාර සහ පෝෂණය පිළිබඳ සීඝ්‍ර අනතුරු ඇඟවීමේ පද්ධතිය යනු යුරෝපා සංගමය තුල ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටළු වාර්තා කරන ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන කිහිපයක් යුරෝපා සංගමයෙන් ලැබෙන RASFF නිවේදන වලට ප්‍රතිචාර දැක්වීමට අදාල ආයතන ලෙස හඳුනාගෙන ඇත. 2020 වසරේදී පැණිරස බිස්කට්, සහල්, බුලත් කොළ, මිරිස්, ශීතකළ මාළු, ඖෂධීය පැළෑටි වැනි ආහාර ද්‍රව්‍ය, ආහාර, පෝෂණ හෝ ආහාර ඇසුරුම් ද්‍රව්‍ය ලෙස නිවේදිත රටෙහි වෙළඳපොළෙහි හෝ යුරෝපා සංගමයේ සීමාව අසල රටක රඳවා තැබූ අනුකූල නොවන නිෂ්පාදන 24 ක් පිළිබඳ හඳුනා ගෙන ඇති බවට වාර්තා වේ. පසුගිය වසරේ එය 15 ක් වූ අතර ඊට සාපේක්ෂව මේ වසරේ ඇඟවීම් නිවේදන මද වශයෙන් වැඩි වීමක් දක්නට ඇත.

- **ශාක ආශ්‍රිත නිෂ්පාදන තොග පිළිබඳ අනුකූලනොවන බවට වූ නිවේදන (EUROPHYT) :**

යුරෝපා සංගමයෙන් ලැබෙන්නාවූ EUROPHYT විමසීම් සඳහා පිළිතුරු දීමට වඩාත් සුදුසුම අදාල රාජ්‍ය ආයතනය ලෙස ජාතික ශාක නිරෝධායන සේවාව හඳුනාගෙන ඇත. ශාක ආශ්‍රිත නිෂ්පාදන තොග සඳහා අනුකූලතා නොවන විමසුම් 85ක් 2020 වසරේදී ලැබී ඇත. වාණිජ දෙපාර්තමේන්තුව විසින් මෙම RASFF සහ EUROPHYT නිවේදන පිළිබඳ වෙනමම දත්ත ගබඩාවක් පවත්වාගෙන යන අතර අවශ්‍ය අවස්ථාවලදී අදාල රාජ්‍ය ආයතන සමහින් පසුවිපරම් කටයුතු සිදු කරනු ලබයි.

- **කාබනික නිෂ්පාදන සහ කාබනික නිෂ්පාදන ලේබල් කිරීම පිළිබඳ යුරෝපා සංගමයේ නව නීති**

කාබනික නිෂ්පාදන සහ කාබනික නිෂ්පාදන ලේබල් කිරීම සම්බන්ධ යුරෝපා සංගමයේ නව නීති 2021 ජනවාරි 1 වන දින සිට බලාත්මක වේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවට මේ නිසා ඇතිවිය හැකි බලපෑම පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා පාලන සංගමය යන ප්‍රධාන පාර්ශවකරුවන් දැනුවත් කරන ලදී. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ කුඩා කාබනික ගොවි සංගමය සමඟ එක්ව මෙම නව නීති නිසා ශ්‍රී ලංකා අපනයනකරුවන්ට ඇතිවිය හැකි බලපෑම පිළිබඳ වාර්තාවක් යුරෝපා සංගමයට ඉදිරිපත් කරන ලදී.

- **අයි අවධානමක් සහිත ශාක, ශාක නිෂ්පාදන සහ අනෙකුත් ද්‍රව්‍ය සඳහා යුරෝපා සංගමයේ නව නීති**

මෙම නව නීති 2019 දෙසැම්බරයේ සිට බලාත්මක විය. පෞද්ගලික අංශයේ අපනයනකරුවන් ඇතුළු පාර්ශවකරුවන්ගේ අදහස් මත ශ්‍රී ලංකාවේ මෙහි සම්බන්ධතාවය පිළිබඳ තාක්ෂණික ලේඛනයක් NPQS විසින් ඉදිරිපත් කර ඇත

ඈ. යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ආයෝජක සංවාදය

යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ආයෝජන සංවාදයේ 10 වන සැසිය 2020 මුල් භාගයේදී එවකට කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කිරීමට නියමිතව තිබුණි. බදුකරණය, විදේශීය සමාගම් ලියාපදිංචි කිරීම, නැව්ගත කිරීම සහ හාණ්ඩ ප්‍රවාහනය, ඉදිකිරීම්, ඉඩම් අත්පත් කර ගැනීම, කොටස් හිමිකාරිත්වය, හිඟ මුදල් නොගෙවීම, වීසා බලපත්‍ර කරුණු, ශ්‍රී ලංකාවේ යුරෝපා සංගම් ආයෝජකයින් මුහුණ දෙන ආහාර රෙගුලාසි යන ක්ෂේත්‍රවල ආයෝජන සම්බන්ධ ගැටළු 11 ක් මීලඟ සැසිවාරයේදී සාකච්ඡා කිරීම සඳහා හඳුනාගෙන ඇතවාණිජ දෙපාර්තමේන්තුව විදේශ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වූ විට, යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ආයෝජක සංවාදය නැවත ආරම්භ කර සම්බන්ධීකරණයේ මූලික ආයතනය ලෙස සේවය කරන ලෙස 2020 නොවැම්බර් මාසයේදී නියම කරන ලදී. ඒ අනුව, ගැටළු 11 සඳහා හඳුනාගෙන ඇති පාර්ශවකරුවන් 14 දෙනාට අදාළ කරුණු පිළිබඳ නවතම යාවත්කාලීන කිරීම් ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ලිපි යවන ලදී. දෙපාර්තමේන්තුවට යාවත්කාලීන කිරීම් ආයතන 05 කින් පමණක් ලැබී තිබේ. 2020 දෙසැම්බර් 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි වාණිජ දෙපාර්තමේන්තුව නැවත වෙළඳ අමාත්‍යාංශයට පවරා ඇති අතර, මෙම දෙපාර්තමේන්තුව විසින් විෂය කරුණු සම්බන්ධීකරණය දිගටම කරගෙන යා යුතුද නැතහොත් අදාළ රේඛීය අමාත්‍යාංශයට හෝ සංවාදය මඟින් යුරෝපා සංගමයේ ආයෝජන සම්බන්ධ ගැටළු සෘජුවම ආවරණය කරන බැවින් ආයෝජන මණ්ඩලයට භාර දිය යුතුද යන්න වෙළඳ අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇත. ආයෝජන මණ්ඩලය විසින්ම අනාගතයේ මෙම කටයුත්ත සංවිධානය කිරීමට සිය අභිමතය පලකර ඇත.

ඉ. සාධාරණ වෙළඳාම සංවර්ධනය පිළිබඳ සහයෝගීතා රාමුව

ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් සහයෝගීතා රාමුව (FOC) පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලෙස වාණිජ දෙපාර්තමේන්තුව වෙත යෝජනා කර ඇති බැවින් යෝජිත FOC සඳහා සුදුසු කෙටුම්පතක් සකස් කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2019 දී, ශ්‍රී ලංකාවේ අදාළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සමඟ යෝජිත සහයෝගීතා රාමුව (FOC) පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම් සිදු කර ඇත. කෙසේ වෙතත්, FOC කෙටුම්පතේ නියමයන් නැවත සලකා බැලීමෙන් අනතුරුව, සාධාරණ වෙළඳ ප්‍රඥප්තිය සහ සහතික කිරීමේ ක්‍රියාවලිය යනාදිය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන්, අපනයන වෙළෙඳපොළ සඳහා ශ්‍රී ලංකාවේ කාබනික උප අංශයට සමාන උප අංශයක් සංවර්ධනය කිරීමට අදාලවන සාධාරණ වෙළඳාමට අදාළ කාර්යයන් වාණිජ දෙපාර්තමේන්තුවෙහි කාර්යය විෂය පථයට අයත් නොවන බව දෙපාර්තමේන්තුව නිරීක්ෂණය කර තිබේ.
එබැවින් යෝජිත සහයෝගීතා රාමුව (FOC) සඳහා අත්සන් තැබීමට ඇති නොහැකියාව පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් බ්‍රසල්ස්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලයට දැනුම් දෙන ලදී. ඒ අනුව, කුඩා හා මධ්‍යම අපනයනකරුවන් හා විශේෂයෙන් ගොවීන් / නිෂ්පාදකයින් යනාදිය සමඟ කටයුතු කරන බිම් මට්ටමේ ක්‍රියාත්මක වන ඕනෑම රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සංවිධානයක් සාධාරණ වෙළඳ නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළට සංවර්ධනය කිරීමේ සහ අවශ්‍ය ලේබල් කිරීමේ අරමුණින් යෝජිත කේන්ද්‍රයට අත්සන් තැබිය යුතු බව වාණිජ දෙපාර්තමේන්තුවේ අදහසයි.

ඊ. යුරෝපා සංගම්- ශ්‍රී ලංකා වෙළඳාම සම්බන්ධිත ආධාර ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය මුලින් සැලසුම් කර තිබුණේ 2016.11.01 සිට 31.10. 2020 දක්වා වසර 4 ක් සඳහා ය. කෙසේ වෙතත්, එය තවත් මාස 4 කින් 2021.02.28 දක්වා දීර්ඝ කර ඇත. ව්‍යාපෘතියේ වරින් වර සමාලෝචන රැස්වීම් ජාතික ව්‍යාපෘති කාර්යාලය (NPO) හරහා පවත්වනු ලබන අතර ද්වි වාර්ෂික ව්‍යාපෘති මෙහෙයුම් කමිටු (PSC) රැස්වීම් භාණ්ඩාගාර ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. යුරෝපා සංගමය මෙම ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන 8ක අරමුදල් සපයා ඇති අතර ජාත්‍යන්තර වෙළඳ

මධ්‍යස්ථානය (ITC) සහ UNIDO ක්‍රියාත්මක කිරීමේ ආයතන ලෙස කටයුතු කරන අතර වාණිජ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියේ ජාතික සම්බන්ධීකාරක වේ.

ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබන ප්‍රධාන වර්ධනයන් කිහිපයක් නම්;

- ජාතික අපනයන ක්‍රමෝපාය (NES) දියත් කිරීම,
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් ජීඑස්පී + (GSP+) මාර්ගෝපදේශ පොත ප්‍රකාශයට පත් කිරීම,
- වෙළඳ ප්‍රතිපත්තිය, වෙළඳ සාකච්ඡා, නිදහස් වෙළඳ ගිවිසුම්, වෙළඳ පිළියන්, සෞඛ්‍ය හා ස්වස්ථතා ගැටළු ආදිය සම්බන්ධ විවිධ සම්මන්ත්‍රණ / පුහුණු / වැඩමුළු පැවැත්වීම.
- ජාතික තත්ත්ව යටිතල පහසුකම් උපායමාර්ගය සහ ජාතික ඇසුරුම් පරීක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සහ
- ලංකා කුරුඳු ආදිය සඳහා භූගෝලීය දර්ශකය (GI) ලබා ගැනීමට සහාය වීම

ඇ. ශ්‍රී ලංකාවෙන් ඇලුමිනියම් පත්‍ර ආනයනය කිරීම පිළිබඳ යුරෝපීය වංචා විරෝධී කාර්යාලයේ විමර්ශනය (OLAF)

ශ්‍රී ලංකාවේ ප්‍රභවය වූ බවට ප්‍රකාශයට පත් කළ නමුත් චීනය ප්‍රභවස්ථානය වන බවට සැක කෙරෙන ඇලුමිනියම් පත්‍ර (එච්එස් කේතය 760711) ශ්‍රී ලංකාවේ සිට යුරෝපා සංගමයට ආනයනය කිරීමට එරෙහිව යුරෝපීය වංචා-විරෝධී කාර්යාලය (OLAF) පරීක්ෂණයක් ආරම්භ කර තිබේ.. ඉහත අනුව, ශ්‍රී ලංකාවෙන් ඇලුමිනියම් පත්‍ර අපනයනය කරන ප්‍රධාන සමාගමක් OLAF විසින් හඳුනාගෙන තිබේ. අපනයනකරු සමඟ සම්බන්ධීකරණයෙන් මෙම විමර්ශන ක්‍රියාවලියට පහසුකම් මෙන්ම සහයෝගය ලබා දෙන ලෙස OLAF විසින් එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන්, වාණිජ දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකා රේගුවෙන් ඉල්ලා සිටින ලදී. ඊට ප්‍රතිචාර වශයෙන්, එකී සමාගමට ප්‍රභව සහතිකයක් නිකුත් කර OLAF විසින් ඉල්ලා ඇති තොරතුරු සන්නිවේදනය කළ ශ්‍රී ලංකාවේ වෙළඳ මණ්ඩලය සමඟින් අදාළ සමාගම හා වාණිජ දෙපාර්තමේන්තුව සම්බන්ධ විය.

VI. එක්සත් රාජධානියේ ගෝලීය තීරුබදු (UKGT) පිළිබඳ සහ නව ජීඑස්පී යෝජනා ක්‍රමය පිළිබඳ එක්සත් රාජධානියේ වැඩිදියුණු කළ රාමුවට අදාළ කරුණු පිළිබඳ මාර්ගගත මහජන උපදේශනය

එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත්වීමෙන් පසු (BREXIT), 2020 මාර්තු මාසයේදී, නව UKGTපිළිබඳ මාර්ගගත සමීක්ෂණයක් පවත්වන ලද අතර, වාණිජ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ ආයතන, වාණිජ මණ්ඩල සහ අපනයන අංශයන්ගෙන් ඒ පිළිබඳව උපදෙස් ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකා අපනයන අංශයේ ප්‍රතිචාර ප්‍රධාන වශයෙන් ඇඟලුම්, තේ, රබර්, කුළුබඩු, පොල්, ධීවර නිෂ්පාදන, පිහන් මැටි, ආහාර සහ පාන වර්ග යන ක්ෂේත්‍රයන්ගෙන් ලබන ලදුව එක්සත් රාජධානියට ඉදිරිපත් කරන ලදී. 2020 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ බොහෝ අභිරුචියන් ද ආවරණය වන පරිදි වාර්තා දෙකක් එක්සත් රාජධානිය විසින් නිකුත් කරන ලදී. 2020 දෙවන භාගයේදී, ලන්ඩන් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයෙන් ලැබුණු තොරතුරුවලට අනුව, එක්සත් රාජධානියේ GSP (UK GSP) හි වැඩිදියුණු කිරීමේ රාමු පහසුකම යටතේ ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයේ GSP+ සහනය යටතේ ලබා දුන් සමාන වරණීය සහනයන් 2021 ජනවාරි 1 සිට එක්සත් රාජධානියේ වෙළඳපොළ තුළදී ද එලෙසින්ම අබාධිතව ලැබෙනු ඇති බවට එක්සත් රාජධානියේ බලධාරීන් සහතික වී තිබේ.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් එක්සත් රාජධානියේ UK GSP යෝජනා ක්‍රමය යටතේ එක්සත් රාජධානියට අපනයන්ය කරන ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා විශේෂ තාක්ෂණික මාර්ගෝපදේශ සපයන අතරම, ප්‍රමුඛ පෙළේ වාණිජ මණ්ඩල සහ නිෂ්පාදන සංගම් ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර ඊමේල් සන්නිවේදන කටයුත්තක් ද සිදු කරන ලදී. ප්‍රභවස්ථාන නීති පිළිබඳ මෙන්ම කලාපීය සහ

ද්වීපාර්ශ්වික සමුච්චිතයන් පිළිබඳ ප්‍රධාන තාක්ෂණික පැහැදිලි කිරීම්, ප්‍රභවස්ථානය පිළිබඳ ස්වයං ප්‍රකාශයක් ලෙස GSP 'A' ආකෘතිය, ප්‍රභවස්ථානය පිළිබඳ සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීම, වාර්තා තබා ගැනීම, සහ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරන්නේ කෙසේද යනාදිය එක්සත් රාජධානියේ නව GSP (UK GSP) හි විශේෂිත ප්‍රායෝගික පැතිකඩ ලෙසින් ඇතුළත් විය.

VII. ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර පුළුල් යුරෝපා සංගම් ප්‍රභවස්ථාන සමුච්චිතය සඳහා වූ යෝජනාව

ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර වෙළඳ පිළිබඳ අනු කමිටුවේ 02 වන රැස්වීමේ පසු විපරම් ක්‍රියාවක් ලෙස ශ්‍රී ලංකාව විසින් වියට්නාමයෙන් ප්‍රභවය වූ රෙදි යොදාගෙන යුරෝපා සංගම් වෙළෙඳපොළ වෙත ඇඟලුම් නිෂ්පාදනය කිරීමෙන් යුරෝපා සංගමයේ පුළුල් සමුච්චිත පහසුකම ඉල්ලුම් කිරීමට වියට්නාම් රෙදිපිළි හා ඇඟලුම් සංගමයේ (VITAS) සහාය ඉල්ලා ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය (JAAF) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් වියට්නාමයට ඉදිරිපත් කර පසුව පසු විපරම් කටයුතු අනුගමනය කර ඇත. වියට්නාම් ප්‍රභවය වූ රෙදිපිළි සමඟ යුරෝපා සංගම් GSP + සහනය භාවිතා කිරීමේ වේගය වැඩි කිරීම තුළින් ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර පුළුල් සමුච්චනයක් ඇති කිරීමෙන් ඇඟලුම් අපනයනයේ වටිනාකම ඉහළ නැංවීමට සැලකිය යුතු දායකත්වයක් සපයනු ඇතැයි JAAF සංගමයේ සුබවාදී මත පලකරයි.

VIII. නව ජපාන ජීඑස්පී (GSP) යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කිරීම

2021 මාර්තු මාසයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත නව ජපන් ජීඑස්පී යෝජනා ක්‍රමයට අනුකූලව 2020 අගෝස්තු 25 වන දින වාණිජ දෙපාර්තමේන්තුව විසින් ජපාන බලධාරීන්ට ලිඛිත යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය හා පෞද්ගලික පාර්ශවකරුවන්ගෙන් අදහස් විමසූ අතර, රෙදිපිළි හා ඇඟලුම්, තේ, ධීවර හා ආහාර සැකසුම් යන අංශ 04 සඳහා ප්‍රධාන වශයෙන් යෝජනා ලැබුණි. මෙම යෝජනාව ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් පසු විපරම් කටයුතු සිදු කෙරෙමින් වෙමින් පවතී.

IX. ශ්‍රී ලංකාව-ඕස්ට්‍රේලියාව වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම

වෙළඳ හා ආයෝජන වැඩි කිරීමෙන් ලැබෙන අන්‍යෝන්‍ය ප්‍රතිලාභ මත ද්වීපාර්ශ්වික ආර්ථික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින් ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව 2017 දී වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුමකට (TIFA) අත්සන් තබන ලදී. TIFA හි දෙවන රැස්වීම 2019 දී කොළඹදී පැවැත්වූ අතර දෙපාර්ශ්වයේම යෝජනා ඇතුළත් කරමින් 2020- 2021 සඳහා කාර්යය සැලැස්මක් සකස් කරන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ TIFA පිළිබඳ කටයුතු කරන මූලික ආයතනය විවිධ අමාත්‍යාංශ අතර දෝලනය වීම හේතුවෙන් කාර්යය සැලැස්ම ක්‍රියාත්මක කිරීම සිදුවී නොමැත. මෙම TIFA පිළිබඳ කටයුතු කරන මූලික ආයතනය ලෙස ලෙස වාණිජ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ රේඛීය අමාත්‍යාංශවලින් නව යෝජනා කිහිපයක් ලබා ගෙන ඇත. සංයුක්ත යෝජනා වෙළඳ අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

1.5.3 කලාපීය කටයුතු අංශය

I. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)

SAPTA සාමාජික රාජ්‍ය වනුයේ බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය හා ශ්‍රී ලංකාව වේ. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1993 අප්‍රේල් මස 11 වන දින අත්සන් කරන ලද අතර 1995 දෙසැම්බර් මස 07 වන දින සිට එය බලාත්මක වන ලදී. එබැවින් දකුණු ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශය (SAFTA) මඟින් SAPTA ගිවිසුම ක්‍රම ක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය කිරීමට නියමිතය. එනිසා, සප්තා යටතේ පවතින තීරුබදු වරණ ක්‍රමිකව අඩුවෙමින් පවතී.

SAPTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ අපනයන 2020 වර්ෂයේ ඇ.ඩො.මි. 0.78 ක අගයක් ගත් අතර 2019 වර්ෂයට වඩා ඇ.ඩො.මි. 1.75 අඩු වීමකි. SAPTA ගිවිසුම යටතේ 2020 වර්ෂයේ අපනයනයන් අතර

වල්කනයිස් රබර්, මූලික ස්වරූපයෙන් පවතින ස්වාභාවික රබර්, ගොතන ලද රෙදි, පාප්ප මැලියම් ප්‍රධාන වේ. SAPTA යටතේ ශ්‍රී ලංකාව ආනයනය කිරීමේ වටිනාකම 2020 දී ඇමරිකානු ඩොලර් මිලියන 0.12 ක් ලෙස සටහන් වූ අතර එය 2019 දී ඇමරිකානු ඩොලර් මිලියන 0.11 සිට සුළු වැඩිවීමකි.

II. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

SAFTA හි සාමාජික රටවල් වන්නේ ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාවයි. 2004 ජනවාරි මාසයේදී ඉස්ලාමාබාද්හි පැවති 12 වන සාර්ක් සමුළුවේදී SAFTA අත්සන් කරන ලද අතර එය 2006 ජනවාරි 1 වන දින සිට බලාත්මක විය.

SAFTA III වන අදියර යටතේ සංවේදී ලැයිස්තු අඩු කිරීම ඇතුළු සාකච්ඡා මේ වන විට සිදුවෙමින් පවතී.

2020 පෙබරවාරි 19 සිට 20 දක්වා නේපාලයේ කත්මණ්ඩු නුවර පැවැත්වීමට නියමිතව තිබූ 10 වන SAFTA විශේෂඥ කමිටු රැස්වීම (COE) කල් දමන ලදී. අවලංගු කිරීමට පෙර,දෙපාර්තමේන්තුව විසින් 2020 පෙබරවාරි 07 වන දින 10 වන SAFTA විශේෂඥ කමිටු රැස්වීම පිළිබඳ (COE) ශ්‍රී ලංකාවේ ස්ථාවරය සකස් කිරීම සඳහා සූදානම් කිරීමේ රැස්වීමක් කැඳවන ලදී. 2020 පෙබරවාරි 13 සහ 26 යන දෙදින තුළ විදේශ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද අන්තර් රාජ්‍ය රැස්වීම් දෙකක දී SAFTA සම්බන්ධ කරුණු පිළිබඳව වාණිජ දෙපාර්තමේන්තුව විසින් සහභාගී වූවන් හට යාවත්කාලීන තොරතුරු ඉදිරිපත් කරන ලදී.

පවත්නා තත්වයන් යටතේ අන්තර් කලාපීය වෙළඳාමට පහසුකම් සැලසීමේ ක්‍රම සහ විධි සාකච්ඡා කිරීම සඳහා සාර්ක් රටවල වාණිජ නිලධාරීන් අප්‍රේල් 8 වන බදාදා වීඩියෝ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. වීඩියෝ සම්මන්ත්‍රණයේදී ආමන්ත්‍රණය කරන ලද විශේෂිත ගැටළු අතරට බැංකු ඇපකරයක් සමඟ පරිලෝකනය කරන ලද පිටපත් / ඩිජිටල් ලෙස අත්සන් කරන ලද ප්‍රභවස්ථාන සහතික (COO) ඉදිරිපත් කිරීම මත වරණීය ආනයන තාවකාලිකව නිෂ්කාශනය කිරීම; අතීතානුබද්ධ ප්‍රභවස්ථාන සහතිකපත් සහ බැංකු ඇපකරය,බැංකු විසින් ගෙවීම් නිදහස් කිරීම සඳහා ලේඛනවල පරිලෝකනය කරන ලද පිටපත් තාවකාලිකව පිළිගැනීම වැනි සුදුසු කොන්දේසීන් ඉදිරිපත් කිරීමට යටත්ව ආනයනයේදී වරණීය තීරුබදු තාවකාලික නිශ්කාෂණය සිදු කිරීම.

SAFTA යටතේ ශ්‍රී ලංකාවේ වෙළඳාම අවම මට්ටමක පවතී; වෙළඳාම බොහෝ දුරට සාර්ක් කලාපයේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වන ඉන්දියාව සහ පාකිස්තානය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) දෙක යටතේ සිදු කරනු ලැබේ.

SAFTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ වාර්තා වූ අපනයන ප්‍රමාණය 2020 වර්ෂයේ දී ඇ.ඩො.මි. 42.25 වන අතර එය 2019 වර්ෂයේ දී ඇ.ඩො.මි. 55.93 වඩා අඩු වීමකි. මේ යටතේ ප්‍රධාන අපනයන අයිතම වන්නේ , ගම්මිරිස් (අඹරා හෝ කුඩුකර නොවේ), දිසිදි පොල්, අලුමිනියම් භාජන,සාදික්කා, වසාවාසි, තේ, ඇඟලුම් ද්‍රව්‍ය, වීදුරු බෝතල්, කඩදාසි පුවරු ලේබල්, කරාබුනැටි ආදියයි. . SAFTA යටතේ ශ්‍රී ලංකාව ආනයනය කිරීමේ වටිනාකම 2020 දී ඇ.ඩො.මි. 4.13 ක් ලෙස සටහන් වූ අතර එය 2019 දී ඇ.ඩො.මි. 6.39 සිට අඩුවීමකි.

III. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)

පෙර බැංකොක් ගිවිසුම වශයෙන් හැඳින්වූ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම, ආසියානු හා ශාන්තිකර කලාප සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාවේ (UN-ESCAP) මූලාරම්භයක් වශයෙන් 1975 වර්ෂයේ දී අත්සන් කරන ලදී. දැනට මෙම ගිවිසුමේ වර්තමාන සහභාගිත්ව රටවල් වනුයේ බංග්ලාදේශය, චීනය, ඉන්දියාව, කොරියානු සමූහාණ්ඩුව, ලාඕසය, මොංගෝලියාව හා ශ්‍රී ලංකාව වේ.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ 4 වන සාකඡා මේ වන විට නිම කර ඇති අතර සහභාගී වූ රාජ්‍යන් විසින් බදු රේඛා 10,461ක් සඳහා බදු සහන ලබා ලබා දෙන ලදී. APTA සාකච්ඡාවන් හි 05 වන වටය යටතේ ස්ථාවර කමිටු (SC) සැසිවාරවල දී (භාණ්ඩ වෙළඳාම පිළිබඳ සාකච්ඡා ඇතුළුව) සහ ආයෝජන, වෙළඳාම පහසුකරණය, සේවා සහ ප්‍රභවස්ථාන නීතිරීති පිළිබඳ වැඩ කණ්ඩායම් රැස්වීම්වලදී වාණිජ දෙපාර්තමේන්තුව අනෙකුත් රාජ්‍ය ආයතන සමඟින් එක්ව කටයුතු කරනු ලබයි.

2020 පෙබරවාරි 03 සිට 05 දක්වා තායිලන්තයේ බැංකොක් නුවර සිට පැවැත්වීමට නියමිතව තිබූ APTA හි 57 වන ස්ථාවර කාරක සභා රැස්වීම සහ 06 වන වැඩ කණ්ඩායම් රැස්වීම් දින නියමයක් නොමැතිව කල් දමන ලදී.

තායිලන්තයේ බැංකොක් නුවර එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ පැවති රැස්වීමක දී ආසියා ගාන්තිකර වෙළඳ ගිවිසුමේ (APTA) හත්වන සාමාජිකයා බවට මොංගෝලියාව පත්වන ලදී. මොංගෝලියාව විසින් ලබාදීමට නියමිත ඊවර, පලතුරු, කුළුබඩු, ඛනිජ, ලී භාණ්ඩ, පිහන් භාණ්ඩ, නූල්, රෙදි සහ මුතු ඇතුළු තීරුබදු රේඛා 366 කින් සමන්විත මූලික සහන ශ්‍රී ලාංකීය අපනයනකරුවන් හට භාවිත කරමින් ප්‍රතිලාභ ලබාගත හැකි වනු ඇත. APTA හි සාමාජික රාජ්‍යයක් ලෙස, බංගලාදේශය, ලාඕසය වැනි APTA ඌන සංවර්ධිත රටවලට මේ වනවිටත් ලබා දී ඇති බදු සහන මොංගෝලියාව වෙත පිරිනැමීමට ලබාදීමට ශ්‍රී ලංකාව ක්‍රියා කරමින් පවතී.

2020 දී ශ්‍රී ලංකාව විසින් ඇමරිකානු ඩොලර් මිලියන 205.29 ක් වටිනා නිෂ්පාදන මොංගෝලියාවට අපනයනය කරන ලද අතර එය 2019 දීට වඩා ඇ. ඩො. මි. 179.70 ක වැඩි වීමකි. 2020 දී APTA යටතේ අපනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩ වන්නේ තේ, පොල්, ඇබකා, සක්‍රිය කාබන්, පොල් කෙඳි, ඇඟලුම්, රබර් අත්වැසුම්, ස්වාභාවික රබර්, ක්ෂණික තේ, පාවිච්චි කරන ලද වායව රබර් ටයර්, දැව අඟුරු, රෙදිපිළි භාණ්ඩ, ඊවර නිෂ්පාදන යනාදියයි. APTA යටතේ ශ්‍රී ලංකාව ආනයනය කිරීමේ වටිනාකම 2020 දී ඇමරිකානු ඩොලර් මිලියන 20.51 ක් ලෙස සටහන් වූ අතර එය 2019 දී ඇමරිකානු ඩොලර් මිලියන 19.88 සිට සුළු වැඩිවීමකි.

IV. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)

වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD) විසින් සංවර්ධනය වන රටවල් අතර වෙළඳ අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා ආරම්භ කරනු ලැබූ ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) 1989 අප්‍රේල් මස 19 වන දින සිට බලාත්මක විය. මෙහි සාමාජික රාජ්‍ය සංඛ්‍යාව 42 කි.

මේ දක්වා, ගෝලීය වෙළඳ වරණ ක්‍රමයේ සාමාජික රාජ්‍ය අතර වෙළඳ එකඟතා වට 03ක් පවත්වා ඇත.

ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව විසින් 2020 වර්ෂයේදී සිදුකළ අපනයන ඇ.ඩො.මි. 89.54 ක් වේ. මෙම ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යටතේ සිදුකළ සමස්ත අපනයන වලින් ප්‍රධානතම අපනයන ද්‍රව්‍ය වනුයේ කුරුඳු ය. එය සමස්ත අපනයන වලින් 86.35% කි. ඉන්පසු ප්‍රධාන අයිතම වනුයේ පිළිවෙලින් ඇලුමිනියම් පීප්ප,බෙර,කැන්,පෙට්ටි හා සමාන බහාලුම් භාජනසහ පොල් ආශ්‍රිත නිෂ්පාදන වේ. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ ආනයන වටිනාකම 2020 දී ඇ.ඩො.මි. 0.17 කි. එය 2019 දී මෙන් ඇමරිකානු ඩොලර් මිලියන 0.03ක වැඩි වීමකි.

V. බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (BIMSTEC)

බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (BIMSTEC) බංගලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය, ශ්‍රී ලංකාව යන දකුණු ආසියානික රටවල් 05කින් හා මියන්මාරය හා තායිලන්තය යන ගිණිකොන දිග ආසියානික රටවල් 02කින් වශයෙන් සමස්ත සාමාජික රාජ්‍ය 07කින් මෙය සමන්විත කලාපීය සංවිධානයක් වේ. 2004 පෙබරවාරි 8 වන දින රාමු ගිවිසුම අත්සන් කිරීමත් සමඟින් මෙම BIMSTEC නිදහස් වෙළඳ කලාප ගිවිසුම පිළිබඳ සාකච්ඡා තායිලන්තයේදී තවදුරටත් සිදුවෙමින් පවතී.

"BIMSTEC නිදහස් වෙළඳ කලාපයෙහි හාණ්ඩ ප්‍රභවය නිර්ණය කිරීම සඳහා නීති" සහ "BIMSTEC-FTA සඳහා ප්‍රභවස්ථාන නීති සහතික කිරීමේ මෙහෙයුම් ක්‍රියාවලිය" හි කෙටුම්පත් පෙළ පිළිබඳ නිරීක්ෂණ මහලේකම් කාර්යාලයට ලබා දෙන ලදී.

22 වන වෙළඳ සාකච්ඡා කමිටුව (TNC) සඳහා 2020 මැයි 20 වන දින සැලසුම් කරන ලද අතථ්‍ය රැස්වීම් සහ 2020 ජුනි 08 වන දින ROO පිළිබඳ BIMSTEC වැඩ කණ්ඩායමේ 12 වන රැස්වීම නොපැවැත්වෙන ලදී.

VI. ඉන්දියානු සාගර කලාපීය වෙරළාසන්න රටවල සංවිධානය (IORA)

ඉන්දියානු සාගර කලාපීය වෙරළාසන්න රටවල සංවිධානය යනු ඉන්දියානු කලාපය තුළ කලාපීය සහයෝගීතාවය වැඩිදියුණු කිරීම හා තිරසර සංවර්ධනය තහවුරු කිරීම අරමුණු කරගත් අන්තර් රාජ්‍ය සංවිධානයකි. සාමාජික රාජ්‍ය 21 කින් මෙම සංවිධානය සමන්විත වේ.

2020 ජනවාරි 30 සිට 31 දක්වා මොරිෂස් හි පැවති අන්තර් කලාපීය වෙළඳ හා ආයෝජන වැඩි දියුණු කිරීම සඳහා IORA විශේෂඥ රැස්වීමට වාණිජ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් සහභාගී වන ලදී. කාර්යය සැලැස්මට අදාළ කරුණු: වෙළඳ හා ආයෝජන පිළිබඳ වැඩ කණ්ඩායම (WGTI) පිළිබඳ රැස්වීමේදී ප්‍රධාන වශයෙන් සාකච්ඡා කරන ලදී.

VII. වෙළඳාම හා ආයෝජනය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලීය සම්බන්ධතා සැලසුම (CCA)

2018 අප්‍රේල් මස පවත්වන ලද පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍යාන්හි ප්‍රධානීන්ගේ (CHOGM) රැස්වීමේ දී පොදුරාජ්‍ය මණ්ඩලීය සම්බන්ධතා සැලසුම (CCA) සම්මත කරන ලදී. මෙම සැලසුම මඟින් අන්තර් පොදුරාජ්‍ය මණ්ඩලීය වෙළඳාම 2030 වන විට ඇ.ඩො.ට්‍රි. 2 බවට පත්කිරීමේ කාර්යයේ දී සහ ආයෝජන පුළුල් කිරීමේ කාර්යයේ දී පොදුරාජ්‍ය මණ්ඩලය හරහා වෙළඳාම හා ආයෝජනය ඉහළ නැංවීමේ අභිලාශයෙන් එහි සාමාජිකයන්ට වෙළඳ හා ආයෝජන කටයුතුවල නිරතවීමේ නව ප්‍රවේශයක් ලබා දෙනු ලැබේ. පොදුරාජ්‍ය මණ්ඩලය සාමාජික රටවල් 53 කින් සමන්විත වේ.

2020 දී ශ්‍රී ලංකාව CCA යටතේ ක්‍රියාකාරීව සහභාගී විය. 2020 පෙබරවාරි 17 සිට 19 දක්වා ලන්ඩනයේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය සම්බන්ධතා වැඩසටහන යටතේ සම්බන්ධතා පොකුරු 2වන සතිය සඳහා ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු සහභාගීත්වය වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව විසින් මාර්ගගත සමීක්ෂණ සම්පූර්ණ කිරීමට ද කටයුතු කර ඇත;

- ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරු සමඟ මෙම දෙපාර්තමේන්තුව 'ස්මාර්ට් ධීවර' පිළිබඳ මාර්ගගත සමීක්ෂණය.
- ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරු සමඟ මෙම දෙපාර්තමේන්තුව 'ස්මාර්ට් කෘෂිකර්මය' පිළිබඳ මාර්ගගත සමීක්ෂණය
- ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව 'පොදුරාජ්‍ය මණ්ඩලයේ යහපත් නියාමන පුහුණුව' පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් සකසන ලද මාර්ගගත සමීක්ෂණය
- පොදුරාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාර අතර ජාලකරණය හා අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් 'පෞද්ගලික අංශ සමීක්ෂණය' සමීක්ෂණය සම්පූර්ණ කරන ලෙස සිය තොරතුරු බෙදා ගන්නා ලෙස ශ්‍රී ලංකාවේ වෙළඳ මණ්ඩල සහ නිෂ්පාදන සංගම් ඇතුළු පෞද්ගලික අංශය වෙත මෙම දෙපාර්තමේන්තුව ඉල්ලා සිටින ලදී.

1.5.4. වෙළඳ ප්‍රවර්ධන අංශය

I. විදේශ වාණිජ නියෝජනය

වෙළඳාම ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සත්කාරක රටවලදී ශ්‍රී ලංකාවේ වාණිජ හා ආර්ථික අපේක්ෂා ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම සඳහා වන වාණිජ දෙපාර්තමේන්තුවේ විදේශ වාණිජ නියෝජනය කිරීමේ කාර්යය එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල 30 ක් නියෝජනය කරන නිලධාරීන් 32 න් සමන්විත වේ.

එතෙර සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා අපනයන අවස්ථා හඳුනා ගැනීම පිණිස වෙළඳපොළ සමීක්ෂණ / වාණිජමය අගයක් සහිත තොරතුරු සම්පාදනය කිරීම.

- සත්කාරක රට තුළ පවතින ද්විපාර්ශවීය, කලාපීය සහ අන්තර්ජාතික නීත්‍යානුකූල බැදීම්වලට අනුකූලව සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්ති වල වෙනස් වීම්, පිළියම් ක්‍රියාමාර්ග සඳහා නිර්දේශයන් ඇතුළු තීරුබදු හා තීරුබදු නොවන පියවරයන් අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීම.

- ශ්‍රී ලංකාවේ අපනයනයන් සඳහා එල්ලවිය හැකි තීරුබදු සහ තීරුබදු නොවන පියවරයන්ගේ අහිතකර බලපෑම අවම කිරීම සඳහා සුදුසු අයුරින් සත්කාරක රටතුළ අදාල නියෝජනයන් සිදුකිරීම.

- ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රදර්ශන / අවස්ථා සඳහා විදේශීය ව්‍යාපාරික දූත පිරිස් සංවිධානය කිරීම.

- ව්‍යාපාරික හමු සඳහා අභ්‍යන්තර මිලදී ගැනීම් නියෝජන සංවිධානය කිරීම, ශ්‍රී ලංකාව තුළ පවත්වන ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය සංවිධානය කිරීම.

- සත්කාරක රටවල ශ්‍රී ලංකාවට සුවිශේෂී (තනි රටක්) ප්‍රවර්ධන මෙහෙයුම් පැවැත්වීම.

- ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා වෙළඳ, ආයෝජන හා සංචාර දූත පිරිස් ශ්‍රී ලංකාව වෙත හා ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවල් වෙත සංවිධානය කිරීම.

- ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා ඒක පුද්ගල ව්‍යාපාරික සංචාර ශ්‍රී ලංකාව වෙත හා ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවල් වෙත සංවිධානය කිරීම.

- සත්කාරක රටවල වෙළඳ, ආයෝජන හා සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්ෂේත්‍ර වල රජයේ නිලධාරීන් සමඟ සම්බන්ධ වීම සහ විවිධ රාජ්‍ය හා ජාත්‍යන්තර සංවිධානවලදී ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික අපේක්ෂා හා සම්බන්ධ ගැටළු / කරුණු වලට අදාළව ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.

- වෙළඳ, ආයෝජන හා සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත විමසුම් සම්බන්ධයෙන් සේවා සැපයීම, විදේශ ව්‍යාපාරිකයන් හමු වීම/ ඔවුන් සමඟ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට තාක්ෂණික සහය සැපයීම, වෙළඳ ආරවුල් නිරාකරණය කර ගැනීම ආදිය සඳහා සහය ලබා දීම.

- විදේශීය වෙළඳපොළ තුළ සිය නිෂ්පාදනය / සන්නාම නාමය ලියාපදිංචි කිරීම සඳහා අපනයනකරුවන්ට / නිෂ්පාදකයින්ට සහය ලබා දීම.

- ශ්‍රී ලංකාවෙන් අපනයන කරන ලද භාණ්ඩ තොග නිෂ්කාශන කටයුතු පහසු කිරීම සඳහා ආනයනික රටෙහි රේගුව / ආහාර සුරක්ෂණ ආයතන සමඟින් මැදිහත් වී කටයුතු කිරීම.

- නිෂ්පාදන වර්ධනය කිරීම, තාක්ෂණය, ඇසුරුම්කරණය, අලෙවිකරණය ආදිය පිළිබඳ දැනුම ලබා ගැනීම / වැඩිදියුණු කිරීම සඳහා විදේශීය ශක්‍යතා ගොඩනැංවීමේ වැඩසටහන් / පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට ශ්‍රී ලාංකික නිෂ්පාදකයින් / වගාකරුවන් වෙත අවස්ථා ලබා ගැනීම.

- ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා අපනයනය සඳහා වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීමට ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය මට්ටමින් වෙළඳාම වෙත බලපෑම් කෙරෙන ප්‍රතිපත්තිමය ගැටළු පිළිබඳ සාරාංශ/ යොමු සකස් කිරීම.

- ආනයනික රටවල් විසින් දියත් කරන ලද ප්‍රපාතන විරෝධී විමර්ශනයන් සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදන යටත්වන අවස්ථාවන් වලදී ඒ සඳහා පිළිතුරු සම්පාදනය කිරීමට සහ සැපයුම් පාර්ශවීය බාධා සඳහා විසඳුම් ලබා ගැනීමට තනි අපනයනකරුවෙකුට අවශ්‍ය පරිදි සකසන ලද සුවිශේෂී මඟපෙන්වීම් මෙන්ම උපදෙස් ලබා දීම.

- විදේශීය කටයුතු අමාත්‍යාංශය විසින් ආරම්භ කොට දියත් කරන ලද "ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය" යන වැඩසටහන් යටතේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- අදාළ රාජ්‍ය ආයතන, වෙළඳ මණ්ඩල, ව්‍යාපාරික සංගම් සහ අදාල පාර්ශවකරුවන් සමඟින් එක්ව ආරම්භ කරන ලද අපනයන, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- නිල සංවර්ධන සහය (Official Development Assistance / ODAS) ට අදාල කාර්යයන් සහ ව්‍යාපෘති බාහිර සම්පත් දෙපාර්තමේන්තුව (Department of external resources) සහ අනෙකුත් රාජ්‍ය සංවිධාන සමඟින් සම්බන්ධ වී හැසිරවීමේ සහ යොමු කිරීමේ කටයුතු සිදු කිරීම (දූත මෙහෙවර කිහිපයක - චීනය /, බීජිං)

- ශ්‍රී ලංකා රජයට සිය අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා සහය ලබා දීම.

වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනට සේවයේ ස්ථාපිත දූත මෙහෙවර කාර්යාල;

I කාණ්ඩයේ තනතුරු		II කාණ්ඩයේ තනතුරු		III කාණ්ඩයේ තනතුරු	
I.	බෙල්ජියම / බ්‍රසල්ස්	I.	ඕස්ට්‍රේලියාව / සිඩ්නි	I.	බ්‍රසීලය / බ්‍රසීලියාව
II.	ඉන්දියාව / නවදිල්ලිය	II.	කැනඩාව / ටොරොන්ටෝ	II.	ඊජිප්තුව / කයිරෝව
III.	ඉතාලිය / රෝමය	III.	චීනය / බීජිං	III.	ඉන්දියාව / චෙන්නායි
IV.	පකිස්ථානය / කරච්චි	IV.	ප්‍රංශය / පැරිස්	IV.	ඉන්දියාව / මුම්බායි
V.	සිංගප්පූරුව	V.	ජර්මනිය / ෆ්‍රෑන්ක්ෆර්ට්	V.	සෞදි අරාබිය / රියාද් රාජධානිය
VI.	ස්විට්සර්ලන්තය / ජිනීවා (ජ්‍යෙෂ්ඨ)	VI.	ජපානය / ටෝකියෝ	VI.	මැලේසියාව / ක්වාලාලම්පූර්
VII.	එක්සත් රාජධානිය / ලන්ඩන් (ජ්‍යෙෂ්ඨ)	VII.	දකුණු කොරියාව / සෝල්	VII.	රුසියාව / මොස්කව්
VIII.	එක්සත් අරාබි එමීර් රාජ්‍යය / ඩුබායි	VIII.	ස්විට්සර්ලන්තය / ජිනීවා (කනිෂ්ඨ)	VIII.	දකුණු අප්‍රිකාව / ප්‍රිටෝරියා
IX.	ඇමරිකා එක්සත් ජනපදය / වොෂිංටන්	IX.	ඇමරිකා එක්සත් ජනපදය / ලොස් ඇන්ජලීස්	IX.	ස්වීඩනය / ස්ටොක්හෝම්
				X.	තායිලන්තය / බැංකොක්
				XI.	තුර්කිය / අන්කාරා

I කාණ්ඩයේ තනතුරු	II කාණ්ඩයේ තනතුරු	III කාණ්ඩයේ තනතුරු
		XII. එක්සත් රාජධානිය / ලන්ඩන් (කනිෂ්ඨ)
		XIII. වියට්නාම් / හැනෝයි
		XIV. ඉන්දුනීසියාව / ජකර්තා

අදාළ කාල පරිච්ඡේදය තුළ එතෙර සේවයේ නියුතු වාණිජ නිලධාරීන් විසින් ඉටුකළ කාර්යය පිළිබඳ සාරාංශයක් පහත වගුවේ දැක්වේ

	කාර්ය	ක්‍රියාකාරකම් ගණන මුළු එකතුවක් ලෙස
1	ව්‍යාපාර ගැලපුම් කටයුතු සිදු කිරීම	1310
2	ව්‍යාපාර ජාල සැසිවාර පැවැත්වීම	114
3	වෙනත් රටවල ශ්‍රී ලාංකික වෙළඳාම ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම	115
4	වෙනත් රටවල පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන/ සල්පිල් සඳහා ශ්‍රී ලාංකීය සහභාගීත්වය සංවිධානය	38
5	ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රදර්ශන/ වෙලඳ සල්පිල් වෙත අභ්‍යන්තර ගැනුම් මෙහෙයුම් සහභාගීත්ව සංවිධානය.	10
6	වෙළඳාම පිළිබඳ පැමිණිලි විසඳීමට කටයුතු කිරීම	121
7	වෙළඳ විමසුම් වෙනුවෙන් කටයුතු කිරීම	2181
8	ශ්‍රී ලාංකීය ප්‍රදර්ශන සත්කාරක/ බලයලත් රට තුළ ප්‍රවර්ධනය කිරීම	22
9	විභවීය ව්‍යාපාරික පාර්ශවකරුවන් සහ වෙළඳ මණ්ඩල හමුවීම් පැවැත්වීම	1415
10	වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ කාරණා සඳහා මැදිහත් වීම.	212
11	ආයෝජන පිළිබඳ සම්මන්ත්‍රණ පැවැත්වීම	68
12	ආයෝජන යෝජනාවන් පිළිබඳ කටයුතු කිරීම	106
13	අයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.	41
14	සංචාරක ප්‍රවර්ධන කාර්යයන් සංවිධානය කිරීම	140
15	වෙනත් රටවල පැවැත්වෙන සංචාරක ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම	15
16	වෙළඳපොළ කොරතුරු වාර්තා කිරීම	490

I. වෙළඳ ප්‍රවර්ධනය

වර්ෂය තුළදී වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද තෝරාගත් ප්‍රධාන වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් පහත ලැයිස්තු ගතකර ඇත;

ඕස්ට්‍රේලියාව

1. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමඟ ඕස්ට්‍රේලියානු ව්‍යාපාරික ප්‍රජාව සම්බන්ධ කර ගැනීම සඳහා ව්‍යාපාර ජාලගත රැස්වීමක් 2020 මාර්තු මාසයේදී බ්‍රිස්බේන් නිදී පවත්වන ලදී
2. ඕස්ට්‍රේලියානු - ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලය පිහිටුවීම සඳහා වූ ව්‍යාපාරික ජාලගත රැස්වීම 2020 දෙසැම්බර් මාසයේදී සිඩ්නි නුවරදී පැවැත්විණි
3. ඕස්ට්‍රේලියාවිහි ශ්‍රී ලාංකික නිෂ්පාදන හා සේවා සඳහා වෙළඳපල වැඩිදියුණු කිරීම පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් 2020 ඔක්තෝබර් 7 වන දින ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) සමඟින් එක්ව සංවිධානය කිරීම.
4. සිලෝන් වාණිජ මණ්ඩලය සහ ඕස්ට්‍රේලියාවේ ව්‍යාපාරික මණ්ඩලයන් කිහිපයක් සමඟ එක්ව ඕස්ට්‍රේලියාව සමඟ ඒකාබද්ධ සහයෝගිතාව සඳහා ව්‍යාපාර පරිසරය සහ අවස්ථාවන් පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම

බෙල්ජියම

1. ශ්‍රී ලංකාවෙන් සිදුකරන අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සමාගම් වෙනුවෙන් SLEDB සහ ලංකා වාණිජ මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරමින් අතථ්‍ය ව්‍යාපාරික රැස්වීම් සංවිධානය කිරීම.
2. බෙල්ජියම් ආහාර කර්මාන්ත සම්මේලනය සහ කෘෂි ආහාර අංශයේ තාක්ෂණික, ව්‍යාපාර සහ කළමනාකරණ නවෝත්පාදනවල ප්‍රමුඛ හවුල්කරුවෙකු වන Wagralim විසින් පවත්වනු ලැබූ අතථ්‍ය සමුළුව සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය.
3. ලක්සම්බර්ග් හි පැවති ඩිජිටල් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සතිය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය
4. ශ්‍රී ලංකාවේ සාධාරණ වෙළඳ සන්නාමය බෙල්ජියමේ Chez Yuman සුපිරි වෙළඳපොලේදී දියත් කිරීම.

බ්‍රසීලය

1. ශ්‍රී ලංකා අපනයනකරුවන් සහ බ්‍රසීලයේ සහ චිලී රාජ්‍යයේ අනාගත ආනයනකරුවන් අතර අතථ්‍ය ව්‍යාපාරික රැස්වීම් හැත්තෑ නවයක් (79) පැවැත්වීම.
2. සාඕ පවුලෝ වාණිජ මණ්ඩලය, බොගෝටා වාණිජ මණ්ඩලය, උරුගුවේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සහ BRICS-PED වාණිජ මණ්ඩලය සමඟ ව්‍යාපාර ජාල සැසි හතරක් (04) සංවිධානය කරන ලදී.
3. ශ්‍රී ලංකාවේ ගරු කොන්සල්වරුන් සමඟින් සාවෝ පවුලෝ, චිලී, කොලොම්බියාව සහ සුරිනාම් හි ව්‍යාපාරික ජාල සැසි හතරක් (04) පවත්වන ලදී.
4. ශ්‍රී ලංකා අපනයනකරුවන් සඳහා බ්‍රසීල වෙළඳපොළට ප්‍රවේශ වීම පිළිබඳ වෙළඳපල දැනුවත් කිරීමේ අථත්‍ය වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම.
5. සාවෝ පවුලෝ වාණිජ මණ්ඩලය සහ ලංකාවේ වාණිජ මණ්ඩලයේ සහාය ඇතිව ශ්‍රී ලංකා සමාගම් 26 ක් සඳහා අතථ්‍ය ව්‍යාපාර ගැලපුම් වැඩසටහනක් පැවැත්වීම.

චීනය

1. ප්‍රෙස්ටිජ් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් සහ සිල්වර් මිල්ස් ලිමිටඩ්, ස්ටුවර්ට්ස් ටී සීමාසහිත ශ්‍රී ලංකා සමාගම් සහ සාරකෙත කාබනික සමාගම අතර උපායමාර්ගික සහයෝගීතා ගිවිසුම් තුනක් අත්සන් කරන ලදී.
2. ෂැංහයි එක්ස්පෝ සඳහා චීනයේ ශ්‍රී ලංකා සමාගම් 07 ක නියෝජිතයින් සමඟ සම්බන්ධීකරණය කිරීමෙන් ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම.
3. ශ්‍රී ලංකා සමාගම් 27 ක් සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ චීන බැංකුව සමඟ සම්බන්ධීකරණයෙන් ව්‍යාපාරික රැස්වීම් සංවිධානය කිරීම

ප්‍රංශය

1. ඇ.ඩො.මී. 50 ක් වටිනා මීටර් 100 ක කේබල් අළුත්වැඩියා නෞකාවක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීම සඳහා කොළඹ ඩොක්යාර්ඩ් පීඑල්සී හි කණ්ඩායමක් පැමිණීම සඳහා ප්‍රංශයේ ප්‍රධාන සබ්මැරීන සහ නැව් තැනීමේ සමාගමක් වන M/s Orange Marine සමඟින් පහසුකම් සැලසීම.
2. ප්‍රංශයේ සුප්‍රසිද්ධ සන්නාමයක් වන "Lacoste" සමඟ ශ්‍රී ලංකා සමාගම් 10 ක් සඳහා අතථ්‍ය රැස්වීම් SLEDB සමඟින් එක්ව සම්බන්ධීකරණයෙන් සංවිධානය කිරීම.
3. "ගෝලීය ඇඟලුම් මූලාශ්‍ර එක්ස්පෝ" හි මාර්ගගත ව්‍යාපාරික වේදිකාවට ශ්‍රී ලංකා සමාගම් 6 ක සහභාගීත්වය SLEDB සමඟ එක්ව සංවිධානය කරන ලදී.
4. ශ්‍රී ලාංකික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර / නව සමාගම් සඳහා "ආහාර අංශයේ ප්‍රංශ ගැනුම්කරුවන් වෙත එළඹෙන ආකාරය හා ගනුදෙනු කරන්නේ කෙසේද" යන මාර්ගගත පුහුණු වැඩසටහන වාණිජ දෙපාර්තමේන්තුව සහ CCI-පැරිස් සමඟ එක්ව සංවිධානය කරන ලදී.

ජර්මනිය

1. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කොළඹ IHK සහ ජර්මනියේ වෙළඳපල උපදේශන සමාගමක් සමඟ අතථ්‍ය රැස්වීම් සංවිධානය කිරීම
2. ඩසල්ඩෝෆ් (Dusseldorf) හි පැවති ජාත්‍යන්තර බෝට්ටු ප්‍රදර්ශනයට සහ නියුරම්බර්ග (Nuremburg) හි බයෝෆැක් (Biofach) 2020 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය.

ඉන්දියාව

1. ශ්‍රී ලංකා සමාගම් 49 ක් සඳහා ඉන්දියාවේ උතුරු හා නැගෙනහිර ප්‍රාන්තවල වෙළඳ හා කර්මාන්ත සංගම් සමඟ අතථ්‍යව්‍යාපාරික රැස්වීම් සංවිධානය කරන ලදී.
2. ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ වෙළඳ හා කර්මාන්ත මණ්ඩල සමඟ එක්ව ව්‍යාපාරික ජාල සැසි 07 ක් සංවිධානය කිරීම.
3. ජාතික ශිල්ප සභාව සහ ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩල එක්ව Indusfood - Tech 2020 වෙළඳ ප්‍රදර්ශනය, SurajKundMela (ජාත්‍යන්තර හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය) සහ FICCI LEADS 2020:"ලොව නැවත පරිකල්පනය" යන ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කරන ලදී
4. EDEX Expo 2020 2020 සඳහා ඉන්දියානු තාක්ෂණ ආයතනයේ සාමාජිකයින් තිදෙනෙකුගේ නියෝජනය සම්බන්ධීකරණය කිරීම.
5. Medicare Colombo 2020 2020 ප්‍රදර්ශනය සඳහා ඉන්දියානු වාණිජ හා කර්මාන්ත සම්මේලනයේ නියෝජිත පිරිසකගේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම.
6. ගෝලීය විද්‍යුත් හා විදුලි අංග නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් සඳහා සංවිධානය කරන ලද "e-connect" අතථ්‍ය ව්‍යාපාරික හමු වැඩසටහනට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම.
7. ඉන්දියානු සමාගමක් වන M/s Sanvic Global India Ltd, සහ ලාංකික සමාගමක් වන M/S Adventis Lanka PLC සහ අපනයන භාණ්ඩ ප්‍රවාහනය කරන සමාගමක් වන M/S Export Freight Lanka Ltd අතර අථත්‍ය ව්‍යාපාරික රැස්වීම් පැවැත්වීම සංවිධානය කිරීම.
8. ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන සහ සැකසූ ආහාර ඉන්දියානු වෙළඳපොළට ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයනකරුවන් 82 දෙනෙකු සහ මුම්බායි හි IMC වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සහභාගීත්වයෙන් "ඉන්දියාව - ශ්‍රී ලංකාවේ අතර වත්මන් ව්‍යාපාරික පරිසරය සහ කෘෂි හා සැකසූ ආහාර අංශයේ ඒකාබද්ධ සහයෝගීතාව සඳහා ඇති අවස්ථාවන්" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම
9. BIMSTEC Expo 2020 ප්‍රදර්ශනය, 'Virtual FMCG supply expo' සැපයුම් ප්‍රදර්ශනය, Specialty Chem 2020 රසායන ද්‍රව්‍ය ප්‍රදර්ශනය, පූනේ අථත්‍ය පොත් ප්‍රදර්ශනය, Ind-Texpo

2020 සහ FICCI වාර්ෂික එක්ස්පෝ 2020 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම.

ජපානය

1. කොහු නිෂ්පාදන, සේර තෙල්, බිස්කට්, තේ සහ මැණික් නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි ජපන් සමාගම් කිහිපයක් ශ්‍රී ලංකා අපනයනකරුවන් සමඟ සම්බන්ධ කිරීම
2. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආරම්භක ව්‍යාපාර හතකට (07) තොරතුරු තාක්ෂණ ආරම්භක වෙබ් සම්මන්ත්‍රණය සඳහා සහභාගී වූවන් 50 ක් පමණ හමුවීමට පහසුකම් සැපයීම
3. ජපාන අනාගත ගැනුම්කරුවන් වෙත ළඟාවීම සඳහා වඩා හොඳ ඉදිරිපත් කිරීමේ ද්‍රව්‍ය සැකසීම සඳහා ආයුර්වේදය සහ ශාකසාර නිෂ්පාදන වෙබ් සම්මන්ත්‍රණ දෙකක් ඊඩීබී සහ ශ්‍රී ලංකා සැපයුම්කරුවන් 07 ක් සමඟින් එක්ව පවත්වන ලදී.
4. ලංකා කුරුඳු ජපානයෙහි ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ කුළුබඩු කවුන්සිලය සහ SLEDB සමඟ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම
5. ශ්‍රී ලංකා අපනයනකරුවන් අතර ජපාන ජීඑස්පී යෝජනා ක්‍රමය පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ජපානයේ ජීඑස්පී යෝජනා ක්‍රමයේ අවස්ථා සහ අපේක්ෂාවන් යන මාතෘකාව යටතේ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී
6. ජපන් වෙළඳපොළට ශ්‍රී ලංකාවෙන් තෑගි අනුවර්තනය කිරීම පිළිබඳ පළමු වෙබ් සම්මන්ත්‍රණ ශ්‍රී ලංකා සමාගම් 60 ක සහභාගීත්වයෙන් පැවැත්විණි. 2 වන වෙබ් සම්මන්ත්‍රණය 2021 හි පළමු කාර්තුවේදී පැවැත්වෙනු ඇත.

එක්සත් රාජධානිය

1. SLEDB සමඟ සම්බන්ධ වී ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් / පොල් කිරි නිෂ්පාදකයින් 05 ක්, වැනිලා වගා කරන්නන් සාරය ලබගන්නන් සමඟ ප්‍රමුඛ පෙළේ අවන්හල් / හෝටල් සඳහා අමුද්‍රව්‍ය සහ අනෙකුත් ආහාර ද්‍රව්‍ය සපයන එක්සත් රාජධානියේ සමාගමක් වන ජෝන් මුවර් (M/s John Mower & Co) සහ සමාගම සඳහා අතථ්‍ය ව්‍යාපාරික රැස්වීම් සංවිධානය කිරීම.
2. PPE සෞඛ්‍ය ඇඳුම් කට්ටල නිෂ්පාදන සැපයීමට උනන්දුවක් දක්වන ශ්‍රී ලංකා ඇඟලුම් සමාගම් 38 ක් එක්සත් රාජධානියේ NHS, ආනයනකරුවන්, බෙදාහරින්නන්, ෆාමසි, සෞඛ්‍ය සේවා වෙළඳසැල් සහ වෛද්‍ය උපකරණවලට අදාල වාණිජ සංගම්වල සාමාජිකයින්හට හඳුන්වා දෙන ලදී.
3. එක්සත් රාජධානියේ ප්‍රධාන සිල්ලර වෙළඳ සමාගමක් වන හොලන්ඩ් ඇන්ඩ් බැරට් (Holland & Barrett) හි වෙළඳ අධ්‍යක්ෂකවරයෙකු සමඟ ශාකසාර හා ආයුර්වේද නිෂ්පාදන නිෂ්පාදනය කරන ශ්‍රී ලංකා සමාගම් 8 ක් (නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස් ලිමිටඩ්, ලින්ක් නැචුරල් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්, බයෝ එක්ස්ට්‍රැක්ට්ස් (පුද්) සමාගම, සිද්ධලේප එක්ස්පෝර්ට්ස් (පුද්) සමාගම, ෆුඩ් ඇන්ඩ් නේචර් පුද්ගලික සමාගම හා HDDES සාරය, බැසිලූර් තේ සහ ඉන්ග්ලිෂ් ටී ෂොප් අතර රැස්වීමක් සංවිධානය කිරීම.
4. ලන්ඩනයේ M/s Prime Trims සමාගම සඳහා ඇඟවුම් (සිනිදු යට ඇඳුම් සහ දිග මේස් නිෂ්පාදන) සම්පූර්ණ කිරීමේ නිෂ්පාදන හැකියාව ඇති ශ්‍රී ලංකා සමාගම් 10 ක් හඳුන්වා දීම.
5. එක්සත් රාජධානියේ ප්‍රධාන සුපිරි වෙළඳසැල් තුනකට එනම් Sainsburys, Waitrose සහ Tesco, "Impra" යන වෙළඳ නාමය හඳුන්වා දීම.
6. වසර 8 කට පසු එක්සත් රාජධානියේ - ශ්‍රී ලංකා ව්‍යාපාරික වාණිජ මණ්ඩලය සාර්ථකව නැවත දියත් කරන ලද අතර එක්සත් රාජධානියේ ලියාපදිංචි සමාගම්වල නියෝජිතයින් සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන / ආයෝජන අංශ නියෝජනය කරන මුල් සාමාජිකයින් සඳහා අතථ්‍ය වැඩසටහනක් සංවිධානය කරන ලදී.
7. SLASSCOM යොමු කිරීමේ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ / BPM ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා SLASSCOM සහ APSL සමඟ එක්ව "SLASSCOM ගෝලීය යොමු කිරීමේ වැඩසටහන්" වෙබ් සම්මන්ත්‍රණය දියත් කිරීම.

මැලේසියාව

1. යාල්පානම වාණිජ මණ්ඩලය සමඟ එක්ව යාපනයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සමගාමීව මැලේසියාවේ නියෝජිතයින් 16 දෙනෙකු සඳහා ව්‍යාපාරික සැසියක් සංවිධානය කිරීම.

2. මැලේසියාවේ නිෂ්පාදකයින්ගේ සම්මේලනයේ සහයෝගයෙන් ශ්‍රී ලංකා සමාගමට සම්පාදන අංශයේ මැලේසියානු සමාගම් හඳුන්වා දීම.
3. ආසියානු උපායමාර්ගික හා නායකත්ව ආයතනය (ASLI)සහ මැලේසියාවේ ශ්‍රී ලංකා ව්‍යාපාරික වාණිජ මණ්ඩලය (MSLBC) සමඟ එක්ව මැලේසියාව සමඟ වෙළඳ හා ආයෝජන හවුල්කාරිත්වය ශක්තිමත් කිරීමේ අරමුණින් වෙළඳ සාකච්ඡාවක් සංවිධානය කිරීම.

රුසියාව

1. PRODEXPO 2020 සඳහා ශ්‍රී ලංකා තේ සමාගම් 05 ක සහභාගීත්වය සම්බන්ධීකරණය.
2. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ශාන්ත පීටර්ස්බර්ග්හි වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සමඟ ශ්‍රී ලංකාවේ ආයෝජන සහ වෙළඳ අවස්ථා පිළිබඳ රුසියානු ව්‍යාපාරික ප්‍රජාවගේ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා මාර්ගගත වට මේස සාකච්ඡාවක් සංවිධානය කිරීම.
3. රුසියාවේ ආනයනකරුවන් සහ සාමාන්‍ය ජනතාව සඳහා පිරිසිදු සිලෝන් කුරුඳු පිළිබඳ දැනුවත් කිරීමේ වෙබ් සම්මන්ත්‍රණයක් දෙසැම්බර් 15 වන දින SLEDB සමඟ සහයෝගයෙන් සංවිධානය කිරීම
4. ලංකා තේ යුක්රේනයේ ගුණාත්මක වෙළඳ ලකුණක් ලෙස සංකේතවත් කිරීම සඳහා ලියාපදිංචි කිරීමේ කටයුතු සාර්ථක කිරීම.

සිංගප්පූරුව

1. ළමුන්ගේ ලිපි ද්‍රව්‍ය සහ සෙල්ලම් බඩු සඳහා ඊ වාණිජ්‍ය වේදිකාවක් වන Q0010 හි ශ්‍රී ලංකා සමාගම් 10 ක් සහ වෙළඳුන් 06 දෙනෙකුගේ සහභාගීත්වයෙන් අථත්‍ය ව්‍යාපාර ගැලපුම් වැඩසටහනක් පැවැත්වීම.
2. ශ්‍රී ලංකා සමාගම් 5 ක සහභාගීත්වයෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික අංග සඳහා Gantner instruments සහ IMS Asia සමාගම් සමඟ අතථ්‍ය ව්‍යාපාර ගැලපුම් සැසියක් පවත්වන ලදී.
3. 'Print Pack' අතථ්‍ය වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකික සමාගම් 16 ක ගේ සහභාගීත්වය SLEDB සමඟ සම්බන්ධීකරණයෙන් සංවිධානය කිරීම.
4. ශ්‍රී ලංකාවේ අපනයන-විශ්වාසනීය ව්‍යාපාර වසංගතයට අනුවර්තනය වී ඇති ආකාරය පිළිබඳව අවධානය යොමු කිරීම සහ නිෂ්පාදන පරාසය වෙනස් කිරීම, විශේෂයෙන් ඇඟලුම් අංශය තුළ ඔවුන්ගේ ව්‍යාපාරයට සහාය වන පුද්ගලික ආරක්ෂක උපකරණ නිෂ්පාදනය කිරීම පිළිබඳව CNBC සමඟ කතා කිරීමට SLEDB සභාපතිවරයාට මාධ්‍ය සම්මුඛ සාකච්ඡාවක් සඳහා පහසුකම් සපයන ලදී.
5. ජනවාර්ගික නිෂ්පාදන සඳහා "අපේ කඩේ" නමින් ඊ-වාණිජ්‍ය ක්‍රම අවස්ථා 2 ක් සහ සන්නාමගත නිෂ්පාදන සඳහා "Singceylon" යනුවෙන් වැඩසටහනක් හඳුන්වා දීම සහ කුඩා ශ්‍රී ලාංකික ආහාර සුපිරි වෙළඳ සැලක් පිහිටුවීම සඳහා පහසුකම් සැපයීම.
6. 'Lion' සන්නාම නාමය ඇති බියර් හඳුන්වාදීම සඳහා සිංගප්පූරු සමාජ හා ආපනශාලා සමඟ සම්බන්ධ වීමට "Lion" බියර් බෙදාහරින්නා හට පහසුකම් සැපයීම.

දකුණු කොරියාව

1. සෝල් නුවර යූ UNIDO-ITPO (ආයෝජන හා තාක්ෂණ ප්‍රවර්ධන කාර්යාලය) සහ ශ්‍රී ලංකාවේ වාණිජ හා කර්මාන්ත සම්මේලනය (FCCISL) සමඟ එක්ව බලශක්ති හා බලශක්ති අංශයේ කොරියානු සහ ශ්‍රී ලංකා සමාගම්වල සහභාගීත්වයෙන් ව්‍යාපාරික සැසියක් සංවිධානය කරන කිරීම.
2. කොරියාවේ පැවති ගෝලීය යටිතල පහසුකම් සහයෝගිතා සමුළුවේදී (GICC) 2020 දී කොරියාවේ ජාත්‍යන්තර කොන්ත්‍රාත්කරුවන්ගේ (ICAK) සංගමය ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය (NCASL) අතර අතථ්‍ය ජාලකරණ වැඩසටහනක් සංවිධානය කරන ලදී.
3. කොරියානු සමාගම් ආරම්භකයින් සමඟ සාකච්ඡා කිරීමට සහ ඒවා විශේෂයෙන් ශ්‍රී ලංකාවේ

තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය ශ්‍රී ලංකා ආරම්භක සමාගම් සමඟ සම්බන්ධ කිරීම සඳහා කොරියානු විශාලතම ආරම්භක සංවිධානය වන "D-CAMP and Front one" සමඟ ජාල සැසියක් සංවිධානය කිරීම.

4. ගෝලීය මහජන ප්‍රසම්පාදන වෙළඳපොල (GPPM) 2020 ජාලකරණ වැඩසටහනට සහභාගී වූ හැන්ෂින් (Hanshin) සපත්තු සමාගම, රූපලාවන්‍ය කර්මාන්තශාලාව සහ කොරියාවේ ෆර්සන් (Firson) ඖෂධ නියෝජිතයින් සමඟ මාර්ගගත සැසි පැවැත්වීම.

තුර්කිය

1. තුර්කි ආර්ථික සම්බන්ධතා මණ්ඩලය (DEIK) සමඟ එක්ව 2020 නොවැම්බර් 18 වන දින සාධනීය "අන්තර් සම්බන්ධිත ව්‍යාපාර ගැලපුම් සැසියක්" ශ්‍රී ලංකා සමාගම් 20ක සහභාගීත්වයෙන් යුතුව සංවිධානය කිරීම.
2. ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර ද්විපාර්ශවික වෙළඳාම වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සහ තුර්කි සමාගම් 80 කට වැඩි සංඛ්‍යාවක් සඳහා හඳුන්වාදීමේ ව්‍යාපාරික ජාල සැසියක් Eskisehir කර්මාන්ත මණ්ඩලය සහ ලංකාවේ වාණිජ මණ්ඩලය සමඟ සහයෝගයෙන්.සංවිධානය කිරීම
3. ශ්‍රී ලංකා හා යුක්‍රේන සමාගම් 75 ක සහභාගීත්වයෙන් යුක්‍රේන වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සහ ලංකාවේ වාණිජ මණ්ඩලයේ සහාය ඇතිව ශ්‍රී ලාංකික හා යුක්‍රේන ව්‍යාපාරික ප්‍රජාව සමඟ "සහයෝගීතාවයේ අපේක්ෂාවන්" පිළිබඳ අතථ්‍ය රැස්වීමක් සංවිධානය කිරීම
4. SLEDB හි සහාය ඇතිව තුර්කි ආනයනකරුවන් / කුළුබඩු සුපිරි වෙළඳපොල දාමයන් සඳහා අතථ්‍ය ජාලකරණ රැවීමක් සංවිධානය කිරීම. ඒ සඳහා තුර්කි ප්‍රමුඛ සමාගම් 17 ක් සහ තුර්කි ඇසුරුම් කළ කුළුබඩු නිෂ්පාදකයින්ගේ සංගමයේ (ABUDER) සභාපති මෙන්ම උසස් නිලධාරීන් සහභාගී වූහ.

එක්සත් අරාබි එමීර් රාජ්‍ය

1. ඩුබායි "Dubai Business Breakfast" ව්‍යාපාරික උදැසන වැඩසටහන සහ ලංකා වාණිජ මණ්ඩලය සමඟ එක්ව "Winning and Succeeding in Dubai" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කළ අතර එයට ශ්‍රී ලංකා සමාගම් 75 ක් පමණ සහභාගී වූහ.
2. ලොව විශාලතම වාර්ෂික ආහාර පාන වෙළඳ ප්‍රදර්ශනය වන Gulfood (ගල්ෆ්වුඩ්) 2020 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම.

ඇමරිකා එක්සත් ජනපදය

1. SLEDB සමඟින් එක්ව ඇමරිකා එක්සත් ජනපදයේ කුළුබඩු ආනයනකරුවන් දෙදෙනෙකු සමඟ අතථ්‍ය ව්‍යාපාර ජාලකරණ සැසියක් සංවිධානය කිරීම
2. ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් ඩී.සී. හි රොනල්ඩ් රේගන් ගොඩනැගිල්ල සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද 9 වන වාර්ෂික Winternational (වින්ටර්නැෂනල්)- අතථ්‍ය වෙළඳපොළට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
3. SLEDB හි සහාය ඇතිව තේ, මැණික් හා ස්වර්ණාභරණ, පොල් මද නිෂ්පාදන, සැකසූ ආහාර නිෂ්පාදන සහ කුළුබඩු ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් ජනපද ගැනුම්කරුවන් සහ ශ්‍රී ලාංකික අපනයනකරුවන් අතර අථත්‍ය රැස්වීම් හතක් සංවිධානය කිරීම.

II. සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම

එතෙර සේවය සඳහා ස්ථානගත කර සිටින වාණිජ නිලධාරීන් රට තුළට සෘජු විදේශ ආයෝජනය ආකර්ෂණය කර ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් අඛණ්ඩව සිදු කරනු ලැබේ. මේ සඳහා එතෙර සිටින ප්‍රධාන ආයෝජකයන් හා ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන සමඟ දැඩි සබඳතා ජාල ඇතිකර ගැනීමේ කාර්යයයේ ඔවුන් නියුක්තව සිටිනු ලැබේ. තවද, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත පුළුල් කිරීම සඳහා ශක්‍යතාවය සහිත හවුල් ව්‍යාපාර පාර්ශවකරුවන් හඳුනා ගැනීම සහ ශ්‍රී ලංකාවෙන් එම රටවලට පැමිණෙන ව්‍යාපාරික දූත පිරිස් සඳහා තනි තනි ව්‍යාපාරික හමුවීම් සංවිධානය කිරීමද මොවුන් විසින් සිදු කරනු ලැබේ. ඒ

අනුව, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ දී වාණිජ නිලධාරීන් විසින් ශක්‍යතා සහිත ආයෝජකයන් ඔවුන්ගේ වෙළඳපොළවල් වලදී හමුවී දිවයින තුළ පවතින ආයෝජන අවස්ථා සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කර ඇත.

ඒ ඒ රටවල ස්ථාපිත වාණිජ නිලධාරීන් විසින් පහසුකම් සපයා ඇති තෝරාගත් ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ;

බ්‍රසීලය

ඖෂධ අංශයේ ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර අවස්ථා සලකා බැලීමට ආරාධනා කරමින් බ්‍රසීලයේ Goiás (SINDIFARGO) ප්‍රාන්තයේ ඖෂධ කර්මාන්ත සංගමයට මාර්ගගත ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වන ලදී.

ප්‍රංශය

1. ශ්‍රී ලංකාව ආයෝජන මණ්ඩලය සහ මෙඩෙෆ් ඉන්ටර්නැෂනල් (MEDEF International) සමඟ එක්ව ප්‍රංශ සමාගම් 20 කට අධික සංඛ්‍යාවක සහ ශ්‍රී ලංකා සමාගම් 15 කට අධික සංඛ්‍යාවක සහභාගීත්වයෙන් ප්‍රංශ ආයෝජකයින් සඳහා "ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම,
2. ප්‍රංශ භාණ්ඩාගාරයෙන් අරමුදල් සම්පාදිත කුඩා කිරි ව්‍යාපෘතිය සඳහා යන්ත්‍රෝපකරණ ස්ථාපිත කිරීම පිණිස ශ්‍රී ලංකාවට පැමිණීමට බොකාඩ් (BOCARD) ප්‍රංශ තාක්ෂණික කණ්ඩායමට පහසුකම් සපයන ලදී. ප්‍රංශ විශේෂඥයින්ගේ තාක්ෂණික සහාය ඇතිව කුඩා කිරි ව්‍යාපෘති 6 ශ්‍රී ලංකාවේ ස්ථාපනය කෙරේ.

ඉන්දියාව

1. ඉන්දු ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලය, දිල්ලි අධිකාරිය සහ ආයෝජන මණ්ඩලය සමඟ එක්ව ඉන්දීය නිෂ්පාදන අංශයේ නියෝජිතයින් සහ ව්‍යාපාරික උපදේශකයින් 73 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ ආයෝජන වාතාවරණය පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
2. සුළු කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර අංශය (MSME) සඳහා BDIE සමඟ එක්ව 2020 ඔක්තෝම්බර් මාසයේදී චෙන්නායි හි පාර්ක් එලන්සා හෝටලයේ (Park Elanza Hotel) ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කරන ලදී

ජපානය

1. කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ සමාගම් 60 ක සහභාගීත්වයෙන් ජපානයේ ඩෙලොයිට් (Deloitte) සමාගම සහ ටෝකියෝ අගනගරයේ රාජ්‍ය සහාය ඇතිව ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රවර්ධන සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.
2. "පශ්චාත් කොවිඩ් ආර්ථික ප්‍රතිසාධනය අභියෝග සහ අවස්ථාවන් - ශ්‍රී ලංකාව සඳහා උපදෙස් - ජපානයේ ප්‍රවීණයන්ගේ අදහස්" ("POST COVID ECONOMIC RECOVERY: CHALLENGES AND OPPORTUNITIES -TIPS FOR SRI LANKA- EXPERTS VIEWS FROM JAPAN) යන මාතෘකාව යටතේ වෙබ් සම්මන්ත්‍රණයක් අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සහ විදේශ අමාත්‍යාංශයේ සහාය ඇතිව පවත්වන ලදී.
3. ජපානය නියෝජනය කරමින් 235 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සමඟ විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධන වෙබ් සම්මන්ත්‍රණ වැඩසටහනක් ආයෝජන මණ්ඩලයේ සහය ඇතිව සංවිධානය කරන ලදී.
4. ජපානයේ දෙවන විශාලතම බලශක්ති සමාගම වන Idametsu (ඉඩමෙට්සු) සමඟ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික අවස්ථා ගවේෂණය කිරීමේ රැස්වීමක් පවත්වන ලදී. එම සමාගමේ කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

එක්සත් රාජධානිය

1. ශ්‍රී ලංකාවේ මෘදුකාංග හා සේවා සමාගම් සංගමය (SLASSCOM) සහ ශ්‍රී ලාංකික වෘත්තිකයන්ගේ සංගමය (APSL) සමඟ එක්ව බ්‍රිතාන්‍ය ශ්‍රී ලාංකික වෘත්තිකයන් අතර ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය සඳහා "ශ්‍රී ලංකාවේ මෘදුකාංග හා සේවා සමාගම් සංගම් SLASSCOM ගෝලීය යොමු කිරීමේ වැඩසටහන" දියත් කිරීම පිළිබඳ වෙබ්

සම්මන්ත්‍රණයක් පැවැත්වීම.

2. විදේශිකයන් සහ සංචාරකයින් සඳහා ශ්‍රී ලංකාවේ රැකවරණ නිවාසයක / සුවතා මධ්‍යස්ථානයක ආයෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දේශීය ව්‍යාපාරික පාර්ශ්වයක් වෙනුවෙන් එක්සත් රාජධානියේ විභවීය ආයෝජකයෙකු හඳුන්වා දීම සඳහා පාර්ශව 03 ක් අතර අතථ්‍ය ගැලපුම් හමු සංවිධානය කරන ලදී

පාකිස්තානය

1. පාකිස්තානයේ ව්‍යාපාරිකයින් පිරිසක් සඳහා පාකිස්තාන-ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදය සමඟ එක්ව ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීය.
2. පාකිස්තානයේ ප්‍රමුඛ කර්මාන්ත විශේෂඥයින්ගෙන් ශ්‍රී ලංකාවේ සීනි නිෂ්පාදන කර්මාන්තය සහ කුකුළු ගොවිපල කර්මාන්තය ආයෝජන සඳහා ආයෝජන ලබා ගැනීමට ඉස්ලාමාබාද්හි මහ කොමසාරිස්ගේ සහාය ඇතිව ආයෝජක රැස්වීම් දෙකක් පැවැත්වීම.

රුසියාව

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ශාන්ත පීටර්ස්බර්ග්හි වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සමඟින් එක්ව ශ්‍රී ලංකාවේ ආයෝජන හා වෙළඳ අවස්ථා පිළිබඳ රුසියානු ව්‍යාපාරික ප්‍රජාවගේ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා මාර්ගගත සාකච්ඡා වටයක් සංවිධානය කරන ලදී.

සිංගප්පූරුව

සමාගම් 15 ක් සමඟ

විදේශීය සෘජු ආයෝජනය පිළිබඳ රජයේ ප්‍රමුඛතා අංශ පිබඳව සඳහන් කරමින් ආයෝජකයින් සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් පවත්වන ලදී. යෝජනා දෙකක් ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර එය 2021 දී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

දකුණු කොරියාව

1. ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා සහ දැක්ම සම්බන්ධයෙන් අනාගත ආයෝජකයින්, ව්‍යාපාරික ආයතන සහ ආයතනික නායකයින් වෙත ප්‍රවර්ධනය කිරීම සඳහා වෙබ් සම්මන්ත්‍රණයක් පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය (BOI) හා කොරියාවේ වෙළඳ ආයෝජන ප්‍රවර්ධන ඒජන්සිය (KOTRA) සමඟ සම්බන්ධීකරණය කිරීම. "කෝට්‍රා ටීවී (KOTRA TV)" යූ ටියුබ් නාලිකාව හරහා 500 කට අධික පිරිසක් මෙම වෙබ් සම්මන්ත්‍රණය නැරඹීමට සහභාගී විය.
2. "කොරියාවේ විදේශීය ධීවර සහයෝගිතා මධ්‍යස්ථානය" (KOFCC) හි වාර්ෂික වැඩමුළුවේදී "ජලජීවී වගා අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා" පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන ලදී. කලින් පටිගත කරන ලද ඉදිරිපත් කිරීම කොරියාවේ "Naver" මාර්ගගත වේදිකාවේ විකාශය විය.
3. කොරියාවේ පැවති ගෝලීය යටිතල පහසුකම් සහයෝගිතා සමුළුවේදී (GICC) 2020 දී කොරියාවේ ජාත්‍යන්තර කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය (ICAK) සහ ශ්‍රී ලංකාවේ ජාතික ඉදිකිරීම් සංගමය (NCASL) අතර අතථ්‍ය රැස්වීමක් සංවිධානය කරන ලදී.

ස්විස්ටර්ලන්තය

ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන ස්විට්සර්ලන්ත ආයෝජකයින් ඉලක්ක කර ගනිමින් "2021 දී ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සහ ආයෝජන විභවතා" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. අනාගත ආයෝජකයින්ගේ ප්‍රයෝජනය සඳහා සාර්ථක ව්‍යාපාරයක් ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යන විදේශීය ආයතන දෙකක ප්‍රවීණ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ ඉදිරිපත් කිරීම් දෙකක් මෙයට අයත් විය.

තායිලන්තය

ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන ටොයෝටා සමාගමේ අගය දාමයට සම්බන්ධ කිරීමේ අවස්ථා සොයා බැලීම සඳහා තායිලන්තයේ ටොයෝටා ඩයිහට්සු (Daihatsu) ඉංජිනේරු සහ නිෂ්පාදන සමාගම, පැනසොනික් ඔටෝමෝටිව් සිස්ටම්ස් ඒෂියා පැසිෆික් (Panasonic Automative Systems Asia Pasific) සමාගම ශ්‍රී ලංකාවේ SLINTEC, SLEDB, සහ ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන හා අපනයනකරුවන්ගේ සංගමය (SLEMEA)

සම්බන්ධ කිරීම.

ඩුබායි

සූර්ය හා සුළං බලශක්ති ව්‍යාපෘතිය පිළිබඳ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ **M/S Phanes Group** සමාගමේ ආයෝජන යෝජනාව ජනාධිපති ලේකම් කාර්යාලය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ආයෝජන මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කිරීම.

වියට්නාමය

වසර 50 ක විධිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සැමරීම සඳහා ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර වෙළඳ හා ආයෝජන අවස්ථා පිළිබඳ ජාත්‍යන්තර වෙබ් සමුළුවක් පැවැත්වීම

III. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

සංචාරක අංශයේ ඇති අසීමිත විභවය හඳුනා ගෙන ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වාණිජ නිලධාරීන් විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහ ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ සහයෝගීතාවයෙන් විදේශ රටවලදී විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී. විශේෂ සමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම, ශ්‍රී ලංකාව සම්බන්ධව ප්‍රවර්ධන ඉසව් සංවිධානය කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් සඳහා සහභාගීවීමට පහසුකම් සැලසීම, ශ්‍රී ලංකාව වෙත මාධ්‍ය දූත පිරිස් හා සංචාරක නියෝජිතයන් සඳහා දැනුවත් කිරීමේ සංචාර සංවිධානය කිරීම, සංචාරක ප්‍රවර්ධන කවුන්සිල් පිහිටුවීම, සත්කාරක රටවල් වලදී ඉලෙක්ට්‍රොනික් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණ ලබාදීම ආදිය ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වාණිජ නිලධාරීන් විසින් යොදාගන්නා ප්‍රධාන උපායමාර්ග අතර වේ.

ශ්‍රී ලංකාවේ එතෙර දූත මණ්ඩල විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා ප්‍රදර්ශන සහ සම්මේලන කාර්යාංශය සහ සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ අනෙකුත් ආයතන සමඟ සහයෝගිතාවයෙන් සංවිධානය කළ ප්‍රධාන කටයුතු කිහිපයක් පහත දැක්වේ;

බෙල්ජියම

1. 2020 ජනවාරි 17 සිට 19 දක්වා පැවති **'Vakanz Expo Luxembourg'**(ලක්සම්බර්ග්) හි ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම
2. 2020 පෙබරවාරි 6 සිට 9 දක්වා පැවති බ්‍රසල්ස් නිවාඩු දින ප්‍රදර්ශනයට **(Brussels Holiday Fair)** ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය.

බ්‍රසීලය

1. බ්‍රසීලියානු සංචාරක ව්‍යාපාර ක්ෂේත්‍රයේ 600 කට අධික සංඛ්‍යාවක් සහභාගී කර ගනිමින් ගමනාන්ත දැනුවත් කිරීමේ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම.
2. ශ්‍රී ලංකාව පිළිබඳ දැනුවත් කිරීම සඳහා බ්‍රසීලයේ සංචාරක ව්‍යාපාර සමාගම් සමඟ මාර්ගගත රැස්වීම් තිස් තුනක් **(33)** පවත්වා ඇති අතර, සංචාරක සීමාවන් ඉවත් කිරීමෙන් පසු රට ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සහාය ඉල්ලා සිටින ලදී.

කැනඩාව

විදේශ අමාත්‍යාංශය සහ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව 2020 ජනවාරි මාසයේදී ටොරොන්ටෝ මෙට්රෝ දුම්රියයන්හි මාසයක් පුරාවට ප්‍රචාරණ ව්‍යාපාරයක් පැවැත්වීම.

චීනය

1. සංචාරකයින් 4800 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා **SLAITO** සමඟ සහයෝගීත්වයෙන් අථත්‍ය රැස්වීමක් පවත්වන ලදී.
2. **CITM Shanghai** සංචාරක ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකාව සඳහා මාර්ගගත මණ්ඩපයක් සංවිධානය කිරීම

ප්‍රංශය

1. "The French accent" නම් නිෂ්පාදන සමාගමේ මාධ්‍යවේදීන් සිව් දෙනෙකු 2020 ජනවාරි 20 සිට 25 දිනවල ශ්‍රී ලංකාවට පැමිණ බණ්ඩාරවෙල ප්‍රදේශයේ සඳුන් ගොවිතැන පිළිබඳ රූගතකිරීම් සිදු කිරීමට පහසුකම් සැපයීම.
2. ARTE TV රූපවාහිනියේ විකාශය වන "Invitation au Voyage" සඳහා සහරාවක් සැකසීම සඳහා "Elephant DOC" නම් නිෂ්පාදන සමාගමේ මාධ්‍යවේදීන් දෙදෙනෙකු 2020 පෙබරවාරි 27 සිට මාර්තු 17 දක්වා දිනයන්හි ශ්‍රී ලංකාව වෙත පැමිණීම සඳහා පහසුකම් සැලසීම.
3. ආයුර්වේදය ප්‍රවර්ධනය කරන "Zen & Go" සමඟ බ්ලොග්කරුවන්ගේ සහ ආයුර්වේද උපදේශකවරුන්ගේ සහභාගීත්වයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම.
4. ස්පාඤ්ඤයේ පැවති FITUR ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණ.

ඉන්දියාව

1. SATTE 2020 හි ශ්‍රී ලංකා සංචාරක හා සංචාරක සමාගම් 63 ක් සහ ශ්‍රී ලංකා ගුවන් සමාගමේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම.
2. BLTM (සංචාරක අංශයේ ව්‍යාපාරික රැස්වීම්, දිරි දීමනා, සමුළු සහ ප්‍රදර්ශන (MICE) සහ සුඛෝපභෝගී සංචාරක වෙළඳපොළ) සඳහා ශ්‍රී ලංකා සංචාරක සමාගම් 18 ක සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම.
3. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ (SLTPB) සහයෝගයෙන් TTF බැංගලෝර් සංචාරක ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම
4. SLTPB සහයෝගයෙන් ශ්‍රී ලංකා ගුවන් සේවය ඇතුළු සංචාරක නියෝජිතයින් 35 දෙනෙකු සහ හෝටල් 8 ක් හාභිර සංචාරක වෙළඳපොළ 2020 (OTM) සඳහා සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම
5. SLTPB සමඟින් ඉන්දියානු ජාත්‍යන්තර චිත්‍රපට සංචාරක සමුළුවේදී (IIFTC) ශ්‍රී ලාංකික කුටියක් සංවිධානය කිරීම.

ඉතාලිය

SLTPB සහයෝගයෙන් 'BIT Milan tourism fair' මිලාන් සංචාරක ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සංචාරක නියෝජිතයින් 12 දෙනෙකුගේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම

එක්සත් රාජධානිය

1. දිනපතා මිලියන 2ක් නරඹන එක්සත් රාජධානියේ ITV හි "This morning show "උදෑසන වැඩසටහනෙහි රූපවාහිනී නිෂ්පාදන කණ්ඩායමක් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක ගමනාන්ත සහ ආහාර රටාව පිළිබඳ සතියක් පුරාවට වැඩසටහනක් රූගත කිරීම සඳහා පහසුකම් සැපයීම. එම කණ්ඩායම විසින් ඉන් පසුව සජීවී ආහාර දර්ශන 03 ක් විකාශය කළේය.
2. සංචාරක ගමනාන්ත: නිවාඩු දින සහ සංචාරක ප්‍රදර්ශනය - ලන්ඩන්" සඳහා ශ්‍රී ලංකා සමාගම් 04 ක සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම.

මැලේසියාව

මැලේසියාවේ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් වනජීවී වාර්තා වීඩියෝ අතථ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කිරීම.

රුසියාව

1. SLTPB, Rossiya Airline සහ Aeroflot යන ආයතනවල සහාය ඇතිව රුසියාවේ සංචාරක නියෝජිතයින් සඳහා තොරතුරු සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.
2. රුසියානු සංචාරක ක්‍රියාකරුවන් 80 දෙනෙකුගේ සහභාගීත්වයෙන් "පශ්චාත් කොවිඩ් 19 කාලය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

සිංගප්පූරුව

සිංගප්පූරුවෙන් එපිට සංචාරක නියෝජිතයින් 50 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා ගුවන් සේවය සමඟ එක්ව මාර්ග සංදර්ශනයක් සහ සංස්කෘතික සංදර්ශනයක් සංවිධානය කරන ලදී.

දකුණු අප්‍රිකාව

සහයෝගී සංචාරක පැකේජ පිරිනැමීම් සඳහා ශ්‍රී ලංකා සංචාරක මෙහෙයවන්නෙකු දකුණු අප්‍රිකානු සංචාරක මෙහෙයවන්නන් හට හඳුන්වා දීම.

දකුණු කොරියාව

1. "Travie" සහරාවේ සිට ශ්‍රී ලංකාව දක්වා මාධ්‍යවේදීන් දෙදෙනෙකු සඳහා හුරුපුරුදුකරවීමේ චාරිකාවක් සංවිධානය කිරීම. ඒ අනුව පිටු 10 කට වඩා වැඩි ගණනක සිත් ඇදගන්නාසුළු පින්තූර සහ තොරතුරු ඇතුළත් ලිපියක් 2020 ජුනි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී.
2. "කොරියානු පදනම" විසින් සංවිධානය කරන ලද "3 වන රාජ්‍ය තාන්ත්‍රික සතිය" සඳහා අතථ්‍ය සංචාරක ප්‍රවර්ධන කුටියක් සංවිධානය කිරීම"
3. සෝල් සිටි සහරාවේ වෙබ් අඩවියේ සහ අනෙකුත් විද්‍යුත් මාධ්‍යවල ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණයන් පිළිබඳ වීඩියෝවක් ප්‍රකාශයට පත් කිරීම සඳහා කොරියානු සංස්කෘතික තානාපති මිත්‍රත්ව සංගමය සමඟ සම්බන්ධීකරණය කිරීම

තායිලන්තය

තායි ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනයට (TITF) ශ්‍රී ලංකා සමාගම් 12 ක සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම.

තුර්කිය

ජාතික දිනය සැමරීමට සමගාමීව ඉස්තාන්බුල් සහ අන්කාරා වෙත සංචාරක ව්‍යාපාර සම්බන්ධතා ජාල සැසිවාරයක් සූදානම් කරන ලදී

එක්සත් අරාබි එමීර් රාජ්‍ය

1. ශ්‍රී ලංකාවේ වෙළඳ, සංචාරක සහ ආයෝජන සහ සංස්කෘතිය ප්‍රවර්ධනය කරමින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රමුඛ පුවත්පත් දෙකක පුවත්පත් අතිරේක දෙකක් සහ ප්‍රවෘත්ති ලිපියක් පළ කිරීම.
2. ශ්‍රී ලංකා ගුවන් සේවය සහ SLTB සමඟ එක්ව ඩුබායි සිට ශ්‍රී ලංකාව දක්වා සංචාරක මෙහෙයවන්නන් කණ්ඩායමක් විසින් හුරුකරවීමේ (FAM tour) චාරිකාවක් සිදු කිරීම සම්බන්ධීකරණය කිරීම.

ඇමරිකා එක්සත් ජනපදය

නිව් යෝර්ක් ටයිම්ස් සංචාරක ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවාහන / සංචාරක සමාගම් 7 ක සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම

වියට්නාමය

CNN විසින් ප්‍රකාශයට පත් කරන ලද 2020 දී සංචාරය කළ යුතු ගමනාන්ත 20 න් එකක් ලෙස ශ්‍රී ලංකාව තෝරා ගැනීම පිළිබඳව වියට්නාම භාෂාවෙන් සමාජ මාධ්‍යවල පලකිරීම

I. වෙළඳ වීමසුම් පිළිබඳ කටයුතු කිරීම

සමාලෝචිත කාලය තුල වාණිජ නිලධාරීන් වෙත වීමසුම් 2181 ක ප්‍රමාණයක් ලැබී ඇති අතර විදේශීය වෙළෙඳපොළ තුල ශ්‍රී ලාංකීය නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව ඒවාට නිසි පිළිතුරු වශයෙන් අදාල තොරතුරු/ මඟපෙන්වීම් ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ අනාගත අපනයනකරුවන්ගෙන් සහ වෙනත් වෙළඳාම ආශ්‍රිත ආයතනවලින් ලද වීමසීම් වාණිජ නිලධාරීන් වෙත වහාම පසු විපරම් කටයුතු සඳහා යොමු කරන ලදී.

II. වෙළඳ ආරවුල් විසඳීම සඳහා සහයෝගය

අපනයන සහ ආනයන කටයුතු ආශ්‍රිත වෙළඳ ආරවුල් ඊට අදාළ පාර්ශව අතර සුහදශීලී අයුරින් විසඳාගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව අතරමැදියෙකු/පහසුකම් සපයන්නෙකු වශයෙන් කටයුතු කරනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළ ලැබී ඇති එවැනි පැමිණිලි 121ක් සම්බන්ධයෙන් එතෙර ස්ථානගත වාණිජ නිලධාරීන්ගේ සහයෝගයෙන් අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

III. නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටිනු ලැබ ඇති පරිදි වෙළඳ අමාත්‍යාංශ ලේකම් විසින් බලය පවරා ඇති පරිදි වාණිජ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණ කාර්යාල, ශාඛා කාර්යාල හෝ විදේශ සමාගම්, අනෙකුත් වෙළඳ හා වාණිජ ව්‍යාපාරවල සේවයේ යොදවා ඇති නිපුණ විදේශ පුද්ගලයන්, උපදේශකයන්, විශේෂඥයන් හා ඔවුන්ගේ යැපෙන්නන් සඳහා එවැනි සේවා නියුක්ත කරවීම් වලින් අපනයන වෙළඳාම, ජාතික ආර්ථිකය සඳහා වන තාක්ෂණික හුවමාරුව හා ඵලදායිතා වැඩිදියුණුව සැලකිල්ලට ගෙන නිර්දේශ ලිපි නිකුත් කරනු ලැබේ.

2020 වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙළඳ හා සේවා අංශවල විදේශිකයන් 96 දෙනෙකු සහ යැපෙන්නන් 92 දෙනෙකු සඳහා නේවාසික වීසා නිර්දේශ ලිපි නිකුත් කරන ලදී.

IV. යුරෝපා සංගමය මඟින් අරමුදල් සම්පාදිත වෙළඳාම ආශ්‍රිත ශක්‍යතා සංවර්ධන ව්‍යාපෘතිය

යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර 18 වන ඒකාබද්ධ කමිටු රැස්වීමට සමගාමීව 2013 දෙසැම්බර් මස 02 වන දින බ්‍රසල්ස්හි පැවති යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වෙළඳ හා ආර්ථික සබඳතා පිළිබඳ ක්‍රියාකාරී කමිටුවට ඉදිරිපත් කළ යෝජනාවට අනුව "යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වෙළඳාම ආශ්‍රිත සහය: කලාපීය හා යුරෝපා සංගමයේ වෙළඳ පොළ තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වෙළඳ කරඟකාරිත්වය වර්ධනය කිරීම" යන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

යුරෝපා සංගමය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන 8ක අරමුදල් සම්පාදනය කිරීම සඳහා එකඟ වූ අතර, අන්තර් ජාතික වෙළඳ මධ්‍යස්ථානය (ITC) හා එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) මෙහි ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර ව්‍යාපෘතියේ රජයේ සම්බන්ධීකාරක ආයතනය වනුයේ වාණිජ දෙපාර්තමේන්තුවයි.

මෙම ව්‍යාපෘතියේ සමස්ත අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ වෙළඳාම අභිමුඛ වර්ධනය හා කලාපීය ඒකාබද්ධතාවය සඳහා දායක වෙමින් එමගින් දුගීබව තුරන් කිරීම සඳහා දායක වීමයි.

2020 වර්ෂය තුළ ව්‍යාපෘතියේ තෝරාගත් ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ;

- විශ්ලේෂණාත්මක හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන අංශයේ වෙළඳ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ සේවය කරන වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා STATA පිළිබඳ පුහුණු පාඨමාලාවක් සංවිධානය කිරීම.

- GSP + හි වර්තමාන තත්ත්වය පිළිබඳ යාවත්කාලීන කිරීමක් සැපයීම සඳහා, GSP+ ප්‍රතිලාභ පිළිබඳ වැඩිදුර දැනුවත් කිරීමක් සහ GSP + සහන උපරිම ලෙස භාවිතා කරන්නේ කෙසේද සහ ප්‍රභවස්ථාන නීති පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කෙරෙන GSP+ සහනයන් පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස පාර්ශවකරුවන් සඳහා 'වැඩි දියුණු කළ වෙළඳපල ප්‍රවේශය සඳහා GSP+' යන මැයෙන් වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම.

- අපනයන නිෂ්පාදන 23 ක් සහ ආනයන නිෂ්පාදන 6 ක් ඇතුළුව නිෂ්පාදන 29 ක් සැලසුම් කිරීමෙන් SLTIP හි පරිශීලක-හිතකාමීත්වය වැඩි දියුණු කරන ලදි. එහි දියත් කිරීම 2021 පෙබරවාරි 09 වන දින සිදු කිරීමට නියමිතය.

- TFA, C කාණ්ඩයේ පියවර සඳහා මාර්ගගත 'ව්‍යාපෘති යෝජනා සංවර්ධනය පිළිබඳ පුහුණු කිරීම' සංවිධානය කිරීම

- මාර්ගගත ව්‍යාපාර නියාමනය කිරීමේ (විශේෂයෙන් COVID-19 හි බලපෑම සැලකිල්ලට ගනිමින්) 'ඔන්ලයින් (මාර්ගගත) වෙළඳාම පිළිබඳ මාර්ගෝපදේශ' වාර්තාව පාරිභෝගික කටයුතු අධිකාරිය වෙත ලබා දෙන ලදී.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) ඉල්ලීම පරිදි ITC විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ නව කෙටුම්පත් පනත සමාලෝචනය කර එය ගෝලීය හොඳම භාවිතයන් මට්ටමට ගෙන ඒමට කටයුතු කරන ලදී.

- ආයෝජන මණ්ඩලය සඳහා ආයෝජන නීති පිළිබඳ පරතර විශ්ලේෂණයක් සිදු කරන ලදී.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හැත්තෑ හතක් (77) ඔවුන්ගේ අපනයන කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කළ යුතු ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහන සම්පූර්ණ කරන ලදී.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ විශ්වවිද්‍යාල සිසුන් දෙසිය විසිඅට දෙනෙකු (228), ITC-NIOE විද්‍යුත් ඉගෙනුම් පහසුකම හරහා ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියා පටිපාටි පිළිබඳව පුහුණුව ලබා ඇත.

- ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ (IT) සේවා සහ බාහිර සේවා සපයන සමාගම් හතක් සහ ඉන්දුන්ත සමාගම් 15 ක් අතර ව්‍යාපාර සැලසුම් වැඩසටහන් පැවැත්වූ අතර එහිදී ශ්‍රී ලංකාවට තොරතුරු තාක්ෂණ සේවා බාහිරින් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් අථත්‍ය රැස්වීම් 60 කට අධික සංඛ්‍යාවක් පවත්වන ලදී.

- සිය සුළු හා මධ්‍ය පරිමාණ සේවාදායකයින්ගේ අවශ්‍යතා වඩා හොඳින් නිරූපණය කිරීම සඳහා එහි කාර්ය සාධනය වැඩි දියුණු කිරීම පිණිස SLASSCOM වෙත සහාය වීම.

- නිෂ්පාදකයින් / සකසනයන් සහ ව්‍යාප්ත කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් පවත්වනු ලබන පුහුණු / දැනුවත් කිරීමේ සැසි පහළොවක් (15).

- ISO 17065 ට එරෙහිව ප්‍රතීතනය සඳහා එස්එල්එස් (SLS) නිෂ්පාදන සහතික කිරීමේ ලකුණ ("SLS Mark") සඳහා අනුකූලතා තක්සේරු කිරීමේ යෝජනා ක්‍රම තුනක්, එනම් බිස්කට්, පීරිටි බෝතල්, බෝතල් කළ පානීය ජලය SLAB වෙත ඉදිරිපත් කිරීම.

- යුරෝපා සංගමයේ නිල ජර්නලයෙහි ලංකා කුරුඳු GI (භූගෝලීය දර්ශකය) ලෙස ලියාපදිංචි වීමේ අයදුම්පත ප්‍රකාශයට පත් කරන ලදී.

1.5.5 පර්යේෂණ හා සංවර්ධන අංශය

I. පර්යේෂණ කටයුතු:

අ. නිදහස් වෙළඳ ගිවිසුම් හා සම්බන්ධ පර්යේෂණ

නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ පහත සඳහන් පර්යේෂණ කටයුතු සිදු කරන ලදී:

- ශ්‍රී ලංකාවේ අපනයන සඳහා කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වයේ (RCEP) බලපෑම
- ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට කරන අපනයන සඳහා යුරෝපීය සංගම්-වියට්නාම නිදහස් වෙළඳ ගිවිසුමේ (EVFTA) බලපෑම
- ඉන්දියානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමෙන් පසු නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම
- ශ්‍රී ලංකා අපනයනකරුවන්ට ඉන්දියානු වෙළඳපොලේදී මුහුණ දිය යුතු තීරුබදු නොවන පියවරයන්
- නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තෝරාගත් හවුල්කාර රටවලට නව විභවීය නිෂ්පාදන

ආ. ශ්‍රී ලංකාව ලෝකය සමඟ සිදු කරන වෙළඳාමට අදාළ පර්යේෂණ

ශ්‍රී ලංකාව ලෝකය සමඟ සිදු කරන වෙළඳාම පිළිබඳ පහත සඳහන් පර්යේෂණ කටයුතු සිදු කරන ලදී:

- වාණිජ නිලධාරීන් සේවය කරන රටවලට ශ්‍රී ලංකාව අපනයනය කරයි
- ලෝක වෙළඳ සංවිධානය යටතේ ශ්‍රී ලංකාව විසින් තීරුබදු බැඳියාවන්
- ශ්‍රී ලංකාවේ ආසියානු කේන්ද්‍රීය ආනයන සහ බටහිර කේන්ද්‍රීය අපනයනය
- 1977 සහ 2019 දී ශ්‍රී ලංකා අපනයන ලෝකය සමඟින් සංසන්දනය කිරීම
- ශ්‍රී ලංකාවේ ආනයන තීරුබදු සහ වෙනත් තීරුබදු
- ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ කාර්යසාධනය තක්සේරු කිරීම
- පරිච්ඡේදය අනුව වෙළඳ ශේෂය, ආනයන සංකේන්ද්‍රණය සහ අපනයන සංකේන්ද්‍රණය
- ශ්‍රී ලංකාව විසින් විදේශ විනිමය සංචිත සඳහා පනවා ඇති ආනයන සීමා කිරීම්වල බලපෑම
- වාණිජ නිලධාරීන් සේවය කරන රටවලට ශ්‍රී ලංකාවට නිෂ්පාදන අපනයනය කිරීමේදී අසමාන වෙළඳපොළ ප්‍රවේශය.

II. වෙළඳපල ප්‍රවේශ අවස්ථා පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම:

අ. ව්‍යාපාරික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්

පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී:

- 'ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අවස්ථා' ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ දී;
- 'වාණිජ දෙපාර්තමේන්තුවේ හා වාණිජ/වෙළඳ නිලධාරීන් විසින් සපයනු ලබන සේවාවන්' ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ මණ්ඩලයේ දී;
- 'ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම් සහ ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය' අපනයන සංවර්ධන මණ්ඩලයේ

III. පුහුණු හා වැඩමුළු

අ. රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පුහුණු හා වැඩමුළු

රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පහත සඳහන් පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී:

- මොණරගල දිස්ත්‍රික් මහලේකම් කාර්යාලයේ ව්‍යාපාරික සේවා මධ්‍යස්ථානයේ (BSC) කාර්ය මණ්ඩලය සඳහා ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම් සහ වෙළඳ තොරතුරු ප්‍රභවයන් පිළිබඳ පුහුණු වැඩසටහන
- වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා "නීති පැනවීමේ සහ නීතිමය ක්‍රියා පටිපාටි" පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය.
- විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට පත් කරන ලද නිලධාරීන් සඳහා අනුස්ථාපන වැඩසටහන.

ආ. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට පත් කරන ලද නිලධාරීන් සඳහා අනුස්ථාපන වැඩසටහන.

වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පහත සඳහන් ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

- වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ උසස් පාඨමාලාව
- වෙළඳ පිළියම්
- කොවිඩ් -19 වසංගතය තත්ත්වය තුළ රටවල් විසින් අනුගමනය කරන ලද වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳ මාර්ගගත පාඨමාලාව

1.5.6 ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම

පහත සඳහන් වරණීය යෝජනා ක්‍රම සහ කලාපීය, ද්විපාර්ශ්වික හා නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරන ශ්‍රී ලංකාවේ සම්භවය සහිත නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කරනු ලැබේ.

- වරණීය තීරුබදු ක්‍රමය (GSP)
- ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
- දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ඉන්දු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)

COVID-19 වසංගතය හමුවේ මෙම වසරේදී සංඛ්‍යාත්මක බලපෑමක් ඇතත් සාමාන්‍ය වැඩ කරන දිනයකදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික 200කට වඩා සහතික නිකුත් කරනු ලැබේ. පූර්ණ කාලීනව ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමේ අංශයට අනුයුක්ත කර ඇති ඒ සම්බන්ධ ඉහළ විශේෂඥ දැනුම හා පලපුරුද්ද සහිත නිලධාරී කණ්ඩායම උපදෙස් ලබාදීම සඳහා සහ වැඩිදුර තොරතුරු පැහැදිලි කරදීම සඳහා සුදානමින් සිටියි. කලින් වේලාව වෙන් කර ගැනීමකින් තොරවම, රාජකාරී වේලාව තුළ ඕනෑම අවස්ථාවක මොවුන් හමුවිය හැකි වේ. මේ සම්බන්ධව වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම වනුයේ;

අ. තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාවය තක්සේරු කිරීම

ආ. අපනයනකරුවන්ගේ තොරතුරු (exporters' profiles) ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම

ඇ. යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අපනයනකරුවන් විසින් සපයනු ලබන පිරිවැය ප්‍රකාශන හා අනෙකුත් ආධාරක ලේඛන ඇගයීම

ඈ. වරණය ලබාදෙන රටවල ඉල්ලීම පරිදි ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම සහ

ඉ. ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත හා විශ්ලේෂණ වාර්තා සකස් කිරීම

I. කොවිඩ් -19 වසංගත තත්ත්වය අතරතුර ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීමේ අඛණ්ඩ සේවාව

කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ආයතන හා පොදු ස්ථාන වසා දැමීමේ තත්ත්වය හමුවේ ප්‍රභවස්ථාන නීති අංශයේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක විය. මාර්තු සිට මැයි දක්වා වූ පළමු අගුලු දැමීමේ කාල සීමාව තුළදී, ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම අඛණ්ඩව පවත්වා ගෙන යන බවට සහතික වෙමින්. මෙම අංශය මූලික කාර්ය මණ්ඩලයක් සමඟ වැඩවාර පදනම මත කටයුතු කරන ලදී.

පළමු අගුලු දැමීමේ සම්පූර්ණ කාල සීමාව තුළදී, දෙපාර්තමේන්තුව විසින් දිනකට සාමාන්‍යයෙන් 50-75 COO සකස් කර නිකුත් කරන ලදී. ක්‍රමයෙන් ව්‍යාපාර ආරම්භ කිරීම සහ අපනයන වැඩි දියුණු කිරීමත් සමඟ මෙම අගය දිනකට 100-150 දක්වා ඉහළ ගොස් ඇති අතර එතැන් සිට සාමාන්‍ය මට්ටමට පැමිණ තිබේ.

අපනයනකරුවන් විසින් ලේඛන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නම්‍යශීලී ක්‍රියා පටිපාටියක් ද වාණිජ දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති අතර, අවශ්‍ය අයදුම්පත් විද්‍යුත් තැපෑලෙන් ඉදිරිපත් කිරීමට ඉඩ සලසා දිනක් ඇතුළත නිලධාරීන් විසින් සකස් කර අනුමත කරනු ලැබේ. වෙළඳ හවුල්කරුවන්ගේ බලධාරීන්ට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන අත්සන් කරන ලද ලේඛනයක් ලබා ගැනීම සඳහා මෙන්ම අවසාන ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීම සඳහා පමණක් භෞතික වශයෙන් වාණිජ දෙපාර්තමේන්තුව වෙත අපනයනකරුවන්ට පැමිණිය යුතු විය. මෙම නම්‍යශීලී ක්‍රියා පටිපාටිය 2021 වසර තුලදී ද පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

<u>වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ප්‍රභවස්ථාන සහතික (2015- 2020)</u>

ගිවිසුම	2015	2016	2017	2018	2019	2020
යුරෝපා සංගමයේ වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (EU GSP)*	72,675	74,003	80,867	43,680	4328	REX
වෙනත් රටවල වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (GSP Other Countries)*	12,465	12,495	12,468	10,884	8775	6,775

අනු එකතුව 1	*85,140*	*86,498*	*93,335*	*54,564*	*13,103*	*6,775*
ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)	11,494	12,621	12,864	12,882	13,743	9,972
පකිස්තාන් -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)	7,320	6,673	6,703	5,265	6,669	5,608
ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)	4,025	4,508	6,038	4,290	5,515	5,806
දකුණු ආසියානු වෙළඳ ගිවිසුම (SAFTA)	231	149	679	557	1,323	671
දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)	304	288	277	239	220	117
ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)	150	143	100	143	137	187
අනු එකතුව 2	*23,524*	*24,382*	*26,661*	*23,376*	*27,607*	*22,361*
මුලු එකතුව	108,664	110,880	119,996	77,940	40,710	29,136

*REX ක්‍රමය (අපනයනකරුගේ ප්‍රකාශය) 2019.07.01 දින සිට ක්‍රියාත්මක කරන ලද බැවින් වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික පත්‍ර සංඛ්‍යාව අඩු වී ඇත.

I. EU GSP REX ලියාපදිංචි ක්‍රමය

ලියාපදිංචි අපනයන ක්‍රමය)REXයනු යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය යටතේ අපනයනය කෙරෙන (භාණ්ඩසඳහා ප්‍රභවස්ථාන සහතික ලබා ගැනීම පිළිබඳව 2017 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන ක්‍රමයකි. REX ක්‍රමය යටතේ ප්‍රභවස්ථාන සහතිකය වෙනුවට අපනයනකරුවාගෙන් ප්‍රකාශයක් පමණක් අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව මෙම ක්‍රමය අදාල කිරීම 2018.01.01 ආරම්භ කරන ලද අතර සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම 2019.07.01 දින සිට බලපැවැත්වෙන ලදී .2020 වන විට REX ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සමාගම් ගණන 146ක් වන අතර සමාගම් 924 ක් මේ වන විට යුරෝපා සංගමයට අපනයනය කිරීම සඳහා REX ක්‍රමය භාවිතා කරයි.

II. විද්‍යුත් පෝළිම් කළමනාකරණ ක්‍රමය (EQMS)

වාණිජ දෙපාර්තමේන්තුව විසින් මහජනතාව වෙත සිදුකරන සේවාවන් විධිමත් අයුරින් කඩිනම් කිරීමේ අරමුණ තවදුරටත් මුල් කරගනිමින් 2019 අවසන් වන විට විද්‍යුත් පෝළිම් කළමනාකරණ ක්‍රමයක් (EQMS) වාණිජ දෙපාර්තමේන්තුව හා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) විසින් එක්ව ක්‍රියාත්මක ලදී. එමඟින් ටෝකන් පතක් නිකුත් කරන අතර පරිශීලකයන්ට අංක දැමූ ටෝකන් පතක් විද්‍යුත් Kiosk යන්ත්‍රයක් මඟින් ලබාගත හැකිය. එහි සඳහන් අංකය අනුව අදාල කවුන්ටරය වෙත අමතන බැවින් දිගු පෝළිමක රැඳීසිටීමේ කාලය වැළැක්වෙනු ඇත. අයදුම්පත් පිළිබඳ යාවත්කාලීන කෙටි පණිවිඩ ලේඛන සම්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන අවස්ථාවන්හි දී පරිශීලකයන් වෙත යැවීමට වාණිජ දෙපාර්තමේන්තුව කටයුතු සලසා ඇති බැවින් දෙපාර්තමේන්තුවේ රැඳී සිටීමින් නිකරුණේ කාලය ගතකිරීම එයින් වැළැක්වෙනු ඇත.

2020 ආරම්භයේ දී ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමේ මූලික සේවාව සඳහා එම ක්‍රමය පරීක්ෂා කර ක්‍රියාත්මක කරන ලදී. COVID-19 වසංගතය නිසා, වෙනත් සේවාවන් සඳහා මෙම ක්‍රමය අත්හදා බැලීම සහ

ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කළ නොහැකි විය. කෙසේ වෙතත්, මෙම ක්‍රමය සඳහා වෙබ් යෙදුම් ඇප් එකක් (Web app) නිර්මාණය කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් මුදුකාංග සැලසුම්කරු සමඟ සාකච්ඡා කර ඇති අතර එමඟින් පරිශීලකයන්ට අන්තර්ජාලය හරහා ටෝකන සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දී ඇත.

III. විද්‍යුත් ප්‍රභවස්ථාන නිකුත්කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාවට නැංවීම (E-COO System)

ITC සහ GIZ හි තාක්ෂණික හා මූල්‍යමය සහයෝගය ඇතිව වාණිජ දෙපාර්තමේන්තුව විසින්, ඉලෙක්ට්‍රොනික ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම සඳහා දැනට පවතින ක්‍රමය, තවදුරටත් එහි වර්තමාන දුර්වලතා පියවා ගැනීම සහ නව අංග එකතු කිරීමේ අරමුණින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. COVID-19 වසංගත තත්ත්වය තුළ මෙම ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ, වර්තමාන ආරක්ෂක අවශ්‍යතා හේතුවෙන් සංචරණ සීමා කිරීම්, වරින් වර අගුලු දැමීම හෝ ඇදිරිනීතිය ක්‍රියාත්මක කිරීම සහ මුහුණට මුහුණලා සිදුකෙරෙන අන්තර්ක්‍රියා අවම කිරීම හේතුවෙන් අපනයනකරුවන් මුහුණ දෙන අභියෝගයන්ට මුහුණ දීම සඳහා ය. ඒ අතරම, සාමාන්‍යයෙන් ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම සහ වෙනත් උපකාරක සේවා විධිමත් කිරීම හා කඩිනම් කිරීම සඳහා එම ක්‍රමය යුහුසුළුව සිදුකරන ලදී.

2020 අවසාන වන විට, වාණිජ දෙපාර්තමේන්තුව විසින් වත්මන් ක්‍රමය පිළිබඳ මූලික තක්සේරු කිරීම් ආරම්භ කර ඇති අතර, LankaClear සහ ICTA සමඟ මූලික සම්බන්ධතා ඇති කර ගන්නා ලදී.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට (IMF) අනුව, ලෝක ආර්ථිකය, අප්‍රේල් මාසයේදී ලොව පුර සිදු කරන ලද මහා අගුළු දැමීම හේතුවෙන් ඇද වැටුණු මහා ආගාදයෙන් ගොඩ ඒමින් සිටී. කොවිඩ්-19 වසංගතයේ අඛණ්ඩව ව්‍යාප්තියත් සමඟ බොහෝ රටවල් නැවත විවෘත කිරීම මන්දගාමී මට්ටමකින් සිදු කරන අතර සමහර රටවල් අවදානමට ලක්විය හැකි ජනගහනය ආරක්ෂා කිරීම සඳහා අර්ධ වශයෙන් අගුලු දැමීම නැවත සිදු කරයි. ලෝක ආර්ථික දැක්ම (WEO) යාවත්කාලීන කිරීමට අනුව; ගෝලීය වර්ධනය 2020 දී සියයට -4.4 ක් ලෙස දක්වා ඇති අතර එය 2020 ජූනි මාසයේ දී සිදු කළ පුරෝකථනයට වඩා තදබල බවින් අඩු සංකෝචනයකි.

කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ 2020 මුල් භාගයේදී ශ්‍රී ලංකාවේ බාහිර වෙළඳ ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස බිඳවැටෙන්නට විය. 2020 මාර්තු - මැයි මාසවල අගුලු දැමීමේ කාල පරිච්ඡේදය තුළ ගෝලීය වශයෙන් ඉල්ලුම අඩපණ වීම සහ දේශීය හා ගෝලීය සැපයුම් කටයුතුවලට ඇති වූ බාධා හේතුවෙන් වෙළඳ අපනයන පහත වැටී ඇති අතර ඉන් පසුව පූර්ව වසංගත මට්ටම දක්වා යථා තත්ත්වයට පත්විය. බොහෝ අත්‍යාවශ්‍ය නොවන ආනයන සඳහා නියාමන සීමාවන් සහිතව වෙළඳ ආනයන සැලකිය යුතු ලෙස පහත වැටුණි.

2020 මහ බැංකු වාර්තාවේ සඳහන් පරිදි, 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන පරිදි මාස අටක කාලය තුළ වෙළඳ හිඟය 2019 වර්ෂයේ ඊට අනුරූප කාලයට සාපේක්ෂව ඇමරිකානු ඩොලර් බිලියනයකින් සංකෝචනය වී ඇත. ආනයන සංකෝචනය, අපනයන සංකෝචනය ඉක්මවායාම වෙළඳ හිඟය පහත වැටීමට හේතු වී ඇත. ඉහත කාලපරිච්ඡේදයේදී ආනයන සඳහා වූ වියදමේ පහත වැටීම ඇ.ඩො.මී. 2628 ක් වූ අතර අපනයනයන්ගෙන් ඉපැයූ ආදායමේ පහත වැටීම ඇ.ඩො.මී. 1585ක් විය. ඒ අනුව, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ වෙළඳ හිඟය 2019 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ.ඩො.මී. 4,855 වූ වටිනාකමේ සිට ඇ.ඩො.මී. 3,812ක් දක්වා අඩුවී ඇත.

තවද, මහ බැංකු වාර්තාවලට අනුව, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ අපනයනවල සමුච්චිත ඉපැයීම් 2019 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේ ඇ.ඩො.මී.8030 හා සසඳන විට ඇමරිකානු ඩොලර් මිලියන 6445 දක්වා 19.7% කින් අඩුවී තිබේ. මෙම පහත වැටීමට හේතු වී ඇත්තේ අගුළු දැමීමේ කාල සීමාව තුළ දේශීය භාණ්ඩ නිෂ්පාදන හා වෙළඳාම ආශ්‍රිත සේවාවන්ට ඇති වූ බාධාවන් සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් දේශීය හා ගෝලීය ඉල්ලුම් හා සැපයුම් දාමයට ඇති වූ බාධක නිසාය. අපනයනගයන්ගේ පහත වැටීම සියලු ප්‍රධාන අපනයන කාණ්ඩයන් හි දක්නට ඇතත් එයට මූලික හේතුව වූයේ ප්‍රධාන වශයෙන් රෙදිපිළි, ඇඟළුම්, තේ, රබර් නිෂ්පාදනයන් ය. කෙසේ වෙතත්, සමාලෝචිත කාල සීමාව තුළ පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදන යන උප අංශ දෙකෙන් සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන ලදී.

වෙළඳාම ප්‍රවර්ධනය කිරීම හා ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් ද්විපාර්ශ්වික, කලාපීය හා බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් සම්බන්ධව ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය මඟින් අඛණ්ඩව අවධානය යොමු කර ඇත. නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) සහ වරණීය වෙළඳ ගිවිසුම් (PTAs) ඔස්සේ වරණයන්ගේ උපරිම භාවිතය හා වෙළඳ පොළ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය වෙළඳ පාර්ශවකරුවන් සමඟ තවදුරටත් කටයුතු කරනු ලැබේ.
නියමයන් මත පාදක බහුපාර්ශ්වික වෙළඳ පද්ධති සඳහා සහාය පළ කරන ලෝක වෙළඳ සංවිධානයේ (WTO) සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව, වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම (Trade Facilitation Agreement – TFA) ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරීව දායක wuuu athara මෙම වෙළඳාම පහසුකරන ගිවිසුම යටතේ වන ශ්‍රී ලංකාවේ බැඳීම් ඉටු කරමින්, ශ්‍රී ලංකා රජය විසින් ලෝක බැංකුවේ සහයෝගිතාවයෙන්

"ශ්‍රී ලංකා වෙළඳ ද්වාරය" (Sri Lanka Trade Portal – SLTIP) ආරම්භ කරන ලදී. මෙම ශ්‍රී ලංකා වෙළඳ ද්වාරයේ වෙළඳාම ආශ්‍රිත නියාමන තොරතුරු තනි වෙබ් අඩවියක් තුළ අන්තර්ගත වේ. පහසු ප්‍රවේශයක් ඔස්සේ කාලනුරූපීව යාවත්කාලීන වෙළඳාම ආශ්‍රිත තොරතුරු සැපයෙන මෙය දේශසීමා හරහා සිදුවන වෙළඳ කටයුතු පහසු කිරීමේ ප්‍රධාන පියවරකි. වෙළඳ පිරිවැය අඩුකිරීමෙන් හා දේශසීමා හරහා සිදුවන බාධා ඉවත් කරමින් අපනයන තරඟකාරිත්වය වැඩිදියුණු කිරීමෙන් සුමට වෙළඳ ප්‍රවාහයක් අපේක්ෂා කෙරේ. පාර්ශවකරුවන් 41 දෙනෙකු සහයෝගය දක්වන ශ්‍රී ලංකා වෙළඳ ද්වාරය වර්තමානයේ පාලනය කරනු ලබන්නේ වාණිජ දෙපාර්තමේන්තුව විසිනි.

2018 අංක 02 දරණ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත හා 2018 අංක 03 දරණ ආරක්ෂණ පියවර පනත යන පනත් දෙකම දේශීය වෙළඳ පොළ තුළ අසාධාරණ තරඟයෙන් හා ආනයන ප්‍රවාහ තුලින් දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීමේ අරමුණින් පනවනු ලැබීය. මෙම පනත් දෙක ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල දෙපාර්තමේන්තුව නියුක්තව සිටියි.

නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන ප්‍රවර්ධන අවස්ථා සහ ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය පිලිබඳව ව්‍යාපාරික ප්‍රජාවේ ප්‍රයෝජනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් වෙළඳ මණ්ඩල සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහය ද ඇතිව වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය තුළදී පවත්වන ලදී.

විදේශ වෙළඳාම වැඩි දියුණු කිරීම, ඉන්දියන් සාගරයේ අපනයනාභිමුඛ ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා උපකාරී වේ. ගෝලීය අපනයන සහ දළ දේශීය නිෂ්පාදනය සඳහා පවතින අඩු අපනයන දායකත්වය සහ මන්දගාමී සෘජු විදේශ ආයෝජන අවශ්‍යතා සම්බන්ධ වර්තමාන අභියෝග සඳහා පිළියම් යෙදිය යුතු වේ. අපනයන භාණ්ඩවල තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම, අපනයන භාණ්ඩවල පටු සංයුතිය විවිධාංගිකරණය කිරීම, අපනයන ගමනාන්ත පුළුල් කිරීම, සේවා අපනයන හඳුනාගැනීම, ගෝලීය වෙළඳ පොළට අවතීර්ණ වීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම, ගෝලීය අගය දාම වෙත එකතුවීම සඳහා ඉහළ අගය එකතු කළ හා ඉහළ තාක්ෂණික මට්ටමකින් යුතු භාණ්ඩ නිෂ්පාදනය කිරීමට නිෂ්පාදන හා කාර්මික අංශ විවිධාංගීකරණය හා දැනුම පාදක කර්මාන්ත සඳහා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම යනාදිය රටේ තිරසාර ආර්ථික වර්ධනය හා ඉලක්කගත අරමුණු හා දැක්ම සාක්ෂාත් කර ගැනීම හා තහවුරු කර ගැනීම සඳහා හඳුනාගත් ප්‍රධාන අංශ වේ.

තවද, එසේ කටයුතු කිරීමේදී දේශීය සැපයුම් හා ධාරිතා සංරෝධක, ප්‍රමිති ආශ්‍රිත ගැටලු ඇතුළුව අපනයන තරඟකාරිත්වය, භාණ්ඩ හා සේවා සඳහා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්, ශ්‍රී ලංකාවේ එතෙර අපනයන සඳහා බලපාන්නා වූ තීරු බදු නොවන සාධක, ලෝක බැංකුවේ (WB) ව්‍යාපාර කිරීමේ පහසුව (Ease of Doing Business) හා ලෝක ආර්ථික සංසදයේ (WEF) ගෝලීය තරඟකාරිත්වය (Global Competitiveness) වැනි ජාත්‍යන්තර ආයෝජන දර්ශක/ප්‍රමිති ආදියෙහි ඉහළ ස්ථාන අත්පත් කර ගැනීම වැනි හා ඒ හා අනුබද්ධිත අත්‍යවශ්‍ය කරුණුවලට පිළියම් යෙදීම සිදු කිරීම තවමත් කළ යුතුව පවතී. සෘජු විදේශ ආයෝජන සැලකූ විට, යටිතල පහසුකම් සඳහා කරනු ලබන ආයෝජන මඟින් තවමත් කර්මාන්ත අංශය උත්තේජනය කර නොමැත. නිෂ්පාදන කර්මාන්තවල, කෘෂි ව්‍යාපාරවල හා විකිණිය හැකි සේවාවල සිදුකරන ආයෝජන ආසියාවේ අනෙකුත් ආර්ථිකයන් හා සංසන්දනය කිරීමේදී ඉතා අවම අගයක් ගනී. එබැවින් ශ්‍රී ලංකාව වෙත වඩාත්ම ප්‍රයෝජනවත් ආයෝජන ව්‍යාපෘති ආකර්ෂණය කරගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

ආර්ථික සබඳතා මෙහෙයවීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සමඟින්, වෙළඳ පාර්ශවකරුවන් සමඟ ආර්ථික සබඳතා වැඩිදියුණු කරගැනීම හා ස්ථාවර කර ගැනීම, දැනට පවතින හා නව ජාත්‍යන්තර වෙළඳ පොළවල්හි වෙළඳපොළ කොටස්කාරිත්වය තවදුරටත් වැඩිකර ගැනීම, තීරු බදු ක්‍රමය හා බදු සංශෝධන සඳහා යෝජිත සරලකිරීම් ඔස්සේ ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි දියුණු කර ගැනීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය

සංවර්ධනය කිරීම හා ව්‍යාපාරික මෙහෙයුම් සඳහා පහසුකම් සැපයීම උදෙසා රජය විසින් සිය ප්‍රයත්න අඛණ්ඩවම දියත් කර ඇත.

2010-2020 දක්වා ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන, අපනයන සහ වෙළඳ ශේෂය පහත පරිදි වේ.

(වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන වලිනි.)

වර්ෂය	අපනයන	වර්ධනය %	ආනයන	වර්ධනය %	සමස්ත වෙළඳාම	වෙළඳ ශේෂය
2011	10,018	20.8	19,703	59.7	29,721	-9,685
2012	9,181	-8.4	17,889	-9.2	27,069	-8,708
2013	10,009	9.0	17,098	-4.4	27,107	-7,088
2014	11,044	10.3	19,246	12.6	30,290	-8,202
2015	10,212	-7.5	18,989	-1.3	29,201	-8,777
2016	10,217	0.1	19,515	2.7	29,732	-9,298
2017	11,411	11.69	21,324	9.2	32,735	-9,913
2018	11,687	2.42	22,069	3.5	33,756	-10,382
2019	11,769	0.7	19,486	-11.7	31,255	-7717
2020	9,912	-15.7	15,606	-19.9	25,518	-5,694

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

.....

ගණන්දීමේ නිලධාරි

නම

තනතුර

දිනය 26.06.2024

D.G.A.P. Dharmapriya
Actg. Director General of Commerce

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2020		සටහන	තක්‍ෂ 2020	2019	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		88,880,000	92,099,000	ඒසීඒ-3
-	තැන්පතු		384,350	2,434,710	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		4,681,883	6,197,239	ඒසීඒ-5
-	වෙනත් ලැබීම්		38,340,766	52,580,666	සටහන 01
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**132,286,999**	153,311,615	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**132,286,999**	153,311,615	
	අඩුකළා : වියදම්				
-	පුනරාවර්තන වියදම් වැටුප්, වේතන සහ අනෙකුත්	5	-	-	

60,030,000.00	සේවක ප්‍රතිලාභ		57,796,266	58,717,545	
34,660,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	27,208,816	41,968,761	ඒසිඒ-2(ii)
42,460,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	40,852,360	32,841,907	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9		-	
137,150,000.00	මුළු පුනරාවර්තන වියදම් (ඇ)		**125,857,442**	133,528,213	
	මූලධන වියදම්				
50,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	27,000	143,163	
1,300,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,181,127	411,142	
5,130,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	4,003,501	8,903,466	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
780,000.00	හැකියා වර්ධනය	14	328,209	2,895,579	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
7,260,000.00	මුළු මූලධන වියදම් (ඉ)		**5,539,837**	12,353,350	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**3,524,440**	9,138,060	
	කැන්පතු ගෙවීම්		384,350	2,434,710	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		3,140,090	6,703,350	ඒසිඒ-5
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		134,921,719	155,019,623	
-	2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		(2,634,720)	(1,708,008)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2020 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2020	2019
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	77,328,929	78,238,297
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	12,816,977	14,358,770
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	294,833
මුළු වත්කම්		**90,145,906**	**92,891,900**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		12,816,977	14,358,770
දේපළ පිරියත හා උපකරණ සංචිතය		77,328,929	78,238,297
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	294,833
මුළු වගකීම්		**90,145,906**	**92,891,900**

පිටු අංක1 සිට 53 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 61 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 28.06.2021	දිනය : 28/06/2021	දිනය : 28/06/2021

කේ. එස්. විජේසිංහ
ගණකාධිකාරි
වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පේ. එම්. හදානි ජයවර්ධන
ලේකම්
වෙළෙඳ අමාත්‍යාංශය
අංක.492, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

D.G.A.P. Dharmapriya
Actg. Director General of Commerce

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020 රු.	2019 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	35,251,116	49,993,413
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	88,880,000	92,099,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**124,131,116**	**142,092,413**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	116,967,772	127,237,541
සහනාධාර සහ මාරුකිරීම්	952,094	933,174
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,526,653	533,333
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	490,303	3,549,033
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**119,936,822**	**132,253,081**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,194,294**	**9,839,332**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	79
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	22,265	4,075
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	192,242	43,870

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**214,507**	**48,024**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	1,536,211	3,449,758
අත්තිකාරම් ගෙවීම්	2,846,740	6,410,148
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**4,382,951**	**9,859,906**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(4,168,444)**	**(9,811,882)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**25,850**	**27,450**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	358,500	2,407,260
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**358,500**	**2,407,260**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	384,350	2,434,710
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**384,350**	**2,434,710**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(25,850)**	**(27,450)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**0**	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**0**	**0**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**0**

3.4. වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		නත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	137,150	137,150	125,857	92%
ප්‍රාග්ධන	7,260	7,260	5,540	76%

3.5. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	77,329	77,329	නැත	100%

3.6. විගණකාධිපති වාර්තාව

විගණකාධිපති වාර්තාව මේ සමග ඇමුණුමක් වශයෙන් ඉදිරිපත් කර ඇත.

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

4.1 දෙපාර්තමේන්තුව සඳහා වන කාර්යසාධන දර්ශක

#	කාර්යසාධන දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස
1	අන්‍යොන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් යටතේ තීරුබදු සහන අත්කර ගැනීම සඳහා ඉල්ලීම් පැවැත්වීම	සිදුකරමින් පවතී
2	අන්‍යොන්‍ය වෙළෙඳ ගිවිසුම් යටතේ තීරුබදු සහන අත්කර ගැනීම සඳහා ඉල්ලීම් පැවැත්වීම	සිදුකරමින් පවතී
3	පවත්වන ලද ඒකාබද්ධ කමිටු රැස්වීම්වාර ගණන	කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් නොපැවැත්වෙන ලදී.පසු විපරම් කටයුතු සිදු කෙරිණි
4	බහුපාර්ශවීය තලය හමුවේ ශ්‍රී ලංකාවේ අභිරුචිය ආරක්ෂා කිරීම	සිදුකරමින් පවතී
5	වාර්තාකරන ලද වෙළෙඳපොළ ප්‍රවේශය සම්බන්ධ ගැටලු සඳහා මැදිහත් වීම සහ විසඳීම	සිදුකරමින් පවතී
6	පැය දෙකක් තුල ප්‍රභවස්ථාන සහතිකපත් නිසි ලෙස නිකුත් කිරීම	100%
7	ව්‍යාපාරික ගැලපුම් හමු (තනි තනි වශයෙන්)	185%
8	සංවිධානය කරන ලද ව්‍යාපාරික ජාලගත කිරීමේ සැසිවාර ගණන	139%
9	සංවිධානය කරන ලද ආයෝජන සම්මන්ත්‍රණ ගණන	124%
10	විදේශ රටවල පවත්වන ලද ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ගණන.	169%
11	තෝරාගන්නා ලද විදේශ රටවල වෙළෙඳ ප්‍රදර්ශන/ සල්පිල් සංවිධානය කිරීම	34%
12	ශ්‍රී ලංකාවේ පවත්වන ලද වෙළෙඳ ප්‍රදර්ශන/ සල්පිල් සඳහා සහභාගි වීමට මිලදී ගැනීමේ විදේශ දූත කණ්ඩායම් සංවිධානය කිරීම.	23%
13	නිදහස් සහ වරණීය වෙළෙඳ ගිවිසුම් යටතේ පවතින ඉඩප්‍රස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ සැසිවාර පැවැත්වීම.	75%
14	විදේශ වෙළෙඳාම සහ ලෝක වෙළෙඳ සංවිධානයේ ගිවිසුම් හි නව වර්ධනයන් පිළිබඳ තේමා කරගත් පුහුණු වැඩසටහන්/ වැඩමුළු පැවැත්වීම සංවිධානය කිරීම.	කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් නොපැවැත්වෙන ලදී.

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීම
ඉලක්ක 17: තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සම්බන්ධතාව පවත්වා ගැනීමේ ක්‍රම ශක්තිමත් කිරීම සහ පුනර්ජීවනය කිරීම.	ඉලක්ක 17:10 ලෝක වෙළෙඳ සංවිධානය යටතේ එහි දෝහා සංවර්ධන සැලැස්මේ සාකච්ඡාවන් නිමා කිරීම මඟින් විශ්වීය, නීතිමය, විවෘත, වෙනස්කොට නොසැලකෙන සහ සමානාත්මතාවයෙන් යුතු බහුපාර්ශවීය වෙළෙඳ පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම	එකම ස්ථාවරයන්හි සිටින අනෙකුත් රටවල් සමඟින් සම්බන්ධ වීමෙන් බහුපාර්ශවීය සම්මේලනයන්හි පොදු ස්ථානයක් සකස් කරගැනීම, ලෝක වෙළෙඳ සංවිධානයේ සාකච්ඡාවන් සඳහා ක්‍රියාකාරීව සහභාගි වීම, අන්‍යොන්‍ය සහ අන්‍යොන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් යටතේ තීරුබදු සහන අත්කර ගැනීමේ සාකච්ඡාවන්හි නිරත වීම.	සිදුකරමින් පවතී
	ඉලක්ක 17:11 2020 වන විට ඌණ සංවර්ධිත රටවල ගෝලීය අපනයනයනයේ කොටස ද්විත්ව කිරීමේ අරමුණින් යුතුව සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයනයන් සුවිශේෂී අයුරින් ඉහළ නැංවීම.	ව්‍යාපාරික ගැලපුම් හමු (තනි තනි වශයෙන්) සංවිධානය කිරීම, තෝරාගත් විදේශීය රටවල ව්‍යාපාරික ජාලගත කිරීමේ සැසිවාර සංවිධානය කිරීම, අපනයනාභිමුඛ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගන්නා ලද විදේශීය රටවල ආයෝජන සමුළු සංවිධානය කිරීම ප්‍රදර්ශන/ තෝරාගත් රටවල වෙළෙඳ සල්පිල් සංවිධානය කිරීම, ශ්‍රී ලංකා වෙළඳ කොරතුරු ද්වාරය (බිහිදොර) පිළිබඳ සක්කාරක ආයතනය ලෙස කටයුතු කිරීම, ශ්‍රී ලංකාවේ පවත්වන වෙළෙඳ ප්‍රදර්ශන/ සල්පිල් සඳහා සහභාගි වීමට මිලදී ගැනීමේ විදේශීය දූත කණ්ඩායම් සංවිධානය කිරීම, තෝරාගත් විදේශ රටවල වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කිරීම ,නිදහස් සහ වරණීය වෙළෙඳ ගිවිසුම් යටතේ පවතින ඉඩප්‍රස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ සැසිවාර පැවැත්වීම, වෙළෙඳ ගිවිසුම් යටතේ බදු සහන පහසුකරණය කිරීමට ප්‍රභවස්ථාන සහතිකපත් කඩිනමින් නිකුත් කිරීම, ඒකාබද්ධ කමිටු රැස්වීම්වාර සංවිධානය කිරීම/ සහභාගි වීම, වාර්තාකරන ලද වෙළෙඳපොළ ප්‍රවේශය සම්බන්ධ ගැටලු සඳහා මැදිහත් වීම සහ විසඳීම.	සිදුකරමින් පවතී

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අභියෝග

i. ප්‍රධාන සාමාජිකයින්ගේ අර්බුදකාරී ගැටළු සහ අභිරුචියන්ගේ ගැටීම් එකිනෙකට පටහැනි වීම හේතුවෙන් කලාපීය මට්ටමේ සාකච්ඡාවන්ට බාධා ඇතිවීම.

ii. විවිධ මතවාදයන් හේතුවෙන් ද්වීපාර්ශවීය ගිවිසුම් පිළිබඳ සාකච්ඡාවන් නතර වීම.

iii. සාකච්ඡා වටය සිදුකෙරුණු කාලසීමාවෙන් පසු, සාකච්ඡා ක්‍රියාවලිය හමුවේ විශාල රටවල ආධිපත්‍යය සැලකිය යුතු ලෙස අඩු වී ඇත. එම නිසා ලෝක වෙළඳ සංවිධානයේ සාකච්ඡාවලදී එකඟතාවයකින් ගිවිසුමකට එළඹීම ආසන්න වශයෙන් කළ නොහැකි දෙයක් බවට පත්ව ඇත. ඒ වෙනුවට ආයෝජන පහසුකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රසම්පාදනය ආදී ක්ෂේත්‍රයන්ගේ බහුපාර්ශවීය මට්ටමේ සාකච්ඡා සිදුකරමින් පවතී.

iv. ශ්‍රී ලංකාවේ අපනයනයන් ප්‍රවර්ධනය කිරීමේදී අනෙකුත් බාධක අවහිරතා අතර සැපයුම් අංශයේ පවතින බාධා.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	67	57	10
කෘතීක	02	01	01
ද්විතියික	62	44	16
ප්‍රාථමික	21	16	05

6.2. දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපෑ ආකාරය

දෙපාර්තමේන්තුව විසින් සහකාර වාණිජ අධ්‍යක්ෂ තනතුරු 10 ක් බඳවාගැනීම සඳහා පියවර ගෙන ඇත. දෙපාර්තමේන්තුවේ වෙළඳ පිළියම් අංශයේ කටයුතු ශක්තිමත් කිරීම සඳහා ආර්ථික විශේෂඥ යන තනතුර සඳහා බඳවාගැනීමේ කටයුතු සිදුකිරීමට නියමිතය. දෙපාර්තමේන්තුවේ දැනට පවතින රියදුරන්ගේ හිඟය එහි නිලධාරීන් සඳහා බලපා ඇත.

කාර්යසාධනය දුර්වල වන අයුරින් කිසිදු බලපෑමක් ඇති නොවීය. කෙසේවෙතත් සමහර තත්ත්වයන් යටතේ එකම වෙලාවේදී එක් අධීක්ෂකයකු හෝ දෙදෙනෙකු යටතේ කාර්යයන් කිහිපයක්ම සිදු කිරීමට දැනට සේවයේ නිරතවන නිලධාරීන්ට සිදුවිය.

6.3 කාර්යමණ්ඩල පුහුණු වැඩසටහන් 2020

වැඩසටහනේ නම	පුහුණුවලත් නිලධාරීන් සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (Rs '000)		වැඩසටහනේ ස්වභාවය දේශීය/ විදේශීය	වැඩසටහනේ පරමාර්ථය
			දේශීය	විදේශීය		
WTO වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ උසස් පාඨමාලාව	01	දින 54	-	345.6	විදේශීය	අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධිත කරුණු
WTO විසින් ප්‍රපාතන විරෝධී සහ ආරක්ෂිත පියවරයන් පිළිබඳ WTO නීතිය සහ WTI විසින් සහනාධාර සහ ප්‍රතිතෝලන බදු පියවරයන් පිළිබඳ WTO නීතිය	01	දින 12	-	76.8	විදේශීය	අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධිත කරුණු
අගය එකතු කළ සංඛ්‍යාන වෙළඳාම පිළිබඳ තේමාත්මක	02	දින 05	-	-	විදේශීය	කොවිඩ් 19 වසංගත තත්ත්වය

පාඨමාලාව						හේතුවෙන් අවලංගු කරන ලදී
වෙළඳ ප්‍රතිපත්තීන් ආර්ථික විශ්ලේෂණය කිරීම පිළිබඳ උසස් පාඨමාලාව	01	දින 09	-	-	විදේශීය	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කල්දමන ලදී
WTO හි ආසියා සහ ශාන්තිකර සාමාජිකයින් සහ නිරීක්ෂකයින් සඳහා WTO RTPC	02	දින 51	-	-	විදේශීය	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කල්දමන ලදී
කීරුබදු නොවන ක්‍රියාමාර්ග (NTMs) පිළිබඳ හඳුන්වාදීමේ මාර්ගගත පාඨමාලාව සහ වසංගතය හමුවේ ඒවායේ අදාලත්වය, දෙවන සංස්කරණය	-	දින 25	-	-	විදේශීය අථත්‍ය ලෙසින්	අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධිත කරුණු
අලුතින් පත් කරන ලද වාණිජ නිලධාරීන් සඳහා අනුස්ථාපන වැඩසටහන	10	දින 16	-	-	දේශීය අථත්‍ය ලෙසින්	අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධිත කරුණු
අලුතින් පත් කරන ලද වාණිජ නිලධාරීන් සඳහා අනුස්ථාපන වැඩසටහන	10	දින 03			දේශීය	අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධිත කරුණු

6.4 ආයතනයේ කාර්යසාධනය සඳහා පුහුණු වැඩසටහන දායක වූ ආකාරය

ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්ති සැලසුම් වර්ධනය කිරීමෙහිලා වාණිජ දෙපාර්තමේන්තුව බහුපාර්ශවීය, කලාපීය සහ ද්විපාර්ශවීය යන මට්ටම් තුනකින් සිය මූලික කාර්යභාරය ඉටුකරයි. ලෝක වෙළඳ සංවිධානය මෙන්ම වෙනත් බහුපාර්ශවීය තලයන්හි දී ශ්‍රී ලංකාවේ අභිරුචියන් නියෝජනය කිරීම, කලාපීය සහ ද්විපාර්ශවීය නිදහස්/වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කිරීම සහ ක්‍රියාත්මක කිරීම, වෙළඳ හා ආර්ථික සහයෝගීතාව සඳහා ඒකාබද්ධ කමිටු මෙහෙයවීම සහ වෙනත් රජයන් සමඟ ඒ හා සමාන ගිවිසුම්වලට එළඹීම යනාදිය මෙම සන්දර්භය තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන වගකීම් කිහිපයකි. වෙළඳාම, ආයෝජනය, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට දායකවන සහ පහසුකම් සලසන වාණිජ දෙපාර්තමේන්තුව විදේශීය රටවල ස්ථාපිත සිය වාණිජ නිලධාරීන් මඟින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය දායකවන පරිදි වැදගත් කාර්යයක් ඉටුකරනු ලබයි.

වාණිජ දෙපාර්තමේන්තුවේ සේවයට කුසලතා මත පදනම් වූ විධිමත් තරඟකාරී විභාග ක්‍රමයකින් දිවයින පුරා අපේක්ෂකයින් අතරින් නිසි විශේෂිත සුදුසුකම් සහිත පුද්ගලයන් රාජ්‍යසේවා කොමිසම මඟින් තෝරාගෙන බඳවාගැනීමට කටයුතු කරනු ලැබේ. බඳවාගැනීමේ දින සිට එම නිලධාරීන්හට දේශීය මෙන්ම ජාත්‍යන්තර

තලයේ නිසි පුහුණු වැඩසටහන් සහ අත්දැකීම් ලබාදෙනු ලබයි. ඒ අතර වෙළඳ ප්‍රතිපත්ති හා ප්‍රවර්ධනය පිළිබඳ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්,වැඩමුළු සහ සම්මන්ත්‍රණ, පශ්චාත් උපාධි, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යටතේ සේවා පුහුණුව ලැබීම් ඇතුලත් වේ. විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ රාජ්‍ය තාන්ත්‍රික සේවා (වාණිජ සහ ආර්ථික) කාර්ය වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත පැවරී ඇත. ඔවුන් බඳවාගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා කාලය තුල නොකඩවා ලබාදෙන සේවයේදී ලැබෙන තාක්ෂණික පුහුණුව සහ අත්දැකීම් වාණිජ දෙපාර්තමෙන්තුවේ ඔවුන්ගේ සේවය සඳහා ප්‍රයෝජනවත් වේ.

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු	අනුකූල වේ		

	හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලකල පවරා දී තිබීම			
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව,	අනුකූල වේ		

	භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලදීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.	අනුකූල වේ		

	571 ප්‍රකාරව කටයුතු කර තිබීම			
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තක්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තක්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		ක්‍රියාත්මක කිරීමේ මට්ටමේ පවතී
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක්	අනුකූල වේ		

	සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		ක්‍රියාත්මක කිරීමේ මට්ටමේ පවතී
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල නොවේ		ක්‍රියාත්මක කිරීමේ මට්ටමේ පවතී
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		ක්‍රියාත්මක කිරීමේ මට්ටමේ පවතී
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ		ක්‍රියාත්මක කිරීමේ මට්ටමේ පවතී
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		